ශ්‍රී ලංකාව තුළ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මානයන් පදනම්ව

# ස්ත්‍රී සිරුර මත කෙරෙන යුද්ධය



**#MINOR**MATTERS

*MinorMatters* යනු ශ්‍රී ලංකාවේ ආගමික සුළුතර කණ්ඩායම්වල අයිතිවාසිකම් හා නිදහස ආරක්ෂා කිරීමට කැපවූ ජාතික ව්‍යාපාරයකි. ආගමික නිදහස වටා බැඳී ඇති ගැටළු පිළිබඳ දැනුම වර්ධනය කිරීමත් යුක්තිය හා ජාතික සහජීවනය වර්ධනය කිරීමට දරන වෑයම් වලට සහය ලබාදීමත් අපගේ අරමුණයි.

මෙම වාර්තාව සම්බන්ධයෙන් සම්පූර්ණ බෙදාහැරීමේ අයිතිය *MinorMatters* සංවිධානය හට පවතියි.

*MinorMatters* ප්‍රකශනයකි

# ශ්‍රී ලංකාව තුළ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස පිළිබඳ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය මානයන් පදනම්ව ස්ත්‍රී සිරුර මත කෙරෙන යුද්ධය

SHREEN SAROOR

# පිදුම

පුත්තලම මුස්ලිම් කාන්තා සංවර්ධන භාරයේ (*MWDT*) කාර්යමණ්ඩලයේ සහ විශේෂයෙන්ම රට තුල වර්ධනය වෙමින් පවතින ආගමික අන්තවාදී සන්දර්භය තුල, කාන්තා හිංසනයට එරෙහිව ක්‍රියාත්මක වන සමහර සහෝදර ක්‍රියාකාරීන්ගේ නොමද සහයෝගයද නොලදුයේ නම් මෙම පර්යේෂණය සාර්ථක නොවනු ඇත. මෙහි සඳහන් සිදුවීම් බොහොමයක්ම විශේෂයෙන් පුත්තලම ප්‍රදේශයේ *MWDT* හි කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ සහායකයින් විසින් වාර්තා කර ඇති බැවින් වින්දිතයින් හඳුනා ගැනීම පහසු විය. කෙසේ වෙතත් මෙම පර්යේෂණයේ සොයා ගැනීම් *FoRB* හි ස්ත්‍රී පුරුෂ භාවය සම්බන්ධයෙන් ගත් කල එය අයිස්බර්ගයක ඉතාම ස්වල්ප ප්‍රමාණයක් වනවා සේම, සීමිත කලාප කිහිපයක සමහර පුළුල් ගැටළු පමණක් ආවරණය කරයි. රාජ්‍ය නිලධාරින් කිහිප දෙනෙක්, ප්‍රධාන වශයෙන් පරිපාලන හා සෞඛ්‍ය වෘත්තිකයින් සහ නීතිඥයින් ද අපගේ සංවාද සඳහා උනන්දුවෙන් දායක වූහ. *MinorMatters* සංවිධානයේ, මූල්‍ය දායකත්වය නොවන්නට මේ පර්යේෂණය යථාර්ථයක් නොවීමට ඉඩ තිබූ අතර විශේෂයෙන්ම *MinorMatters* හි නීති හා පර්යේෂණ නිලධාරිනී සලෝමි ද සිල්වා මෙනවියට අපගේ හෘදයාංගම ස්තූතිය පුද කරමු.

මෙම පර්යේෂණය සඳහා ෆාතිමා නිෆ්ලා නසීර් මහත්මියගෙන්, විශේෂයෙන්ම පුත්තලම හා මඩකලපුව දිස්ත්‍රික්ක වල වින්දිතයින් සොයා ගැනීමේදී හා සම්මුඛ සාකච්ඡා පැවැත්වීමේදී ලද දැඩි සහයෝගය සුවිශේෂීව අගය කරමු. එමෙන්ම වෛද්‍ය ෆාරා මිහිලාර්, අමීර් ෆායිස් මහතා සහ මුබද්දසා වහීඩ් මහත්මියගෙන්ද ලද සහය බෙහෙවින්ම වටනේය. ලිපි සැකසීමෙන් හා දිරි ගැන්වීමෙන් මහඟු සේ උපකාරී වූ මාගේ හිතවත් මිතුරිය මිතිලි බාලාට අපගේ සුවිශේෂී ස්තුතිය හිමි වේ.

අවසාන වශයෙන් සිය වේදනාකාරී අත්දැකීම් බෙදා ගැනීමට ඉදිරිපත් වූ සහ නිර්භීතව සාක්ෂි ලබා දුන් සැමට අපගේ හෘදයාංගම ස්තුතිය පුද කරමු. ඔවුන්ගේ සහයෝගය නොලැබූයේ නම් මෙම පර්යේෂණය හෝ අපගේ ප්‍රතිපත්ති, නිර්දේශ හෝ ඉදිරිපත් කල නොහැකි වනු ඇත.

**ශ්‍රීන් අබ්දුල් සරූර්**
කතුවරිය
2023 ජූලි මස 20 දින

# පටුන

page 01 සන්දර්භය: වර්ධනය වෙමින් පවතින මුස්ලිම් විරෝධී මතවාද

page 03 ස්ත්‍රී පුරුෂ භාවය සහ අන්තර් ගැටීම්, *FoRB* උල්ලංඝනයන් පිළිබඳ හැඳින්වීම

page 06 ශ්‍රී ලංකාවේ සිදු වූ පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් මුස්ලිම් කාන්තාවන් කෙරෙහි වන බලපෑම

page 25 නිගමන හා නිර්දේශ

# සන්දර්භය: වර්ධනය වෙමින් පවතින මුස්ලිම් විරෝධී මතවාද

ශ්‍රී ලංකාවේ ඉස්ලාම භීතිකාව යනු දැනට පවතින මුස්ලිම් විරෝධී වෛරයට සහය වීමට හා එය ඉදිරියට ගෙන යාමට ලබා ගත් පහසු මෙවලමකි. සිංහල ජාතිකවාදීන්ට නම් මෙය අවසන් වූ එල්ටීටීඊය සමඟ පැවති යුද්ධය පිලිබඳ අවධානය වෙනත් සුළුතර ප්‍රජාවක් කෙරෙහි යොමු කර වීමකි. කලාපය තුල (ඉන්දියාවේ සිට තායිලන්තයට හා මියන්මාරයට) වර්ධනය වන මුස්ලිම් විරෝධී මතවාදයන් මත පදනම්ව ඥාණසාර වැනි රැඩිකල් භික්ෂූන් 2014 දී වෛරී ප්‍රකාශ ප්‍රචාරණය කර මුස්ලිම්වරුන්ට එරෙහිව කැරලි ඇවිලවූහ. රාජපක්ෂ පරිපාලනයට සමපාත වූ මේ ක්‍රියාවන්හි වූදිතයින් මුළුමනින්ම දණ්ඩ මුක්තිය ලැබූහ. 2019 පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව සහ රාජපක්ෂවරු යලි බලයට පැමිණීමෙන් පසුව, මුස්ලිම් ප්‍රජාවට එරෙහි වෛරී ප්‍රකාශ සහ ප්‍රචණ්ඩත්වය ශීඝ්‍ර ලෙස වර්ධනය විය. මෙම වෛරයේ කොටස් කරුවන්, මුස්ලිම් ප්‍රජාව පිළිබඳව අවධානය යොමු කරමින් වැඩි වශයෙන් කාන්තා ඇඳුම් පැළඳුම්, ජනගහණ වර්ධනය, ආර්ථික සමෘධිය සහ ආගමික සභා රැස්වීම් ගැන අසත්‍ය ප්‍රචාර පතුරවමින් විවිධ අවස්ථාවන්හිදී මුස්ලිම්වරුන් පාලනයට ලක් කිරීම සාධාරණීකරණය කරයි.

පාස්කු ප්‍රහාරයෙන් පසුව රජය හදිසි නීති රෙගුලාසි (*ER*) යටතේ මුස්ලිම් කාන්තාවන්ගේ මුහුණු ආවරණ තහනම් කල අතර ඔවුන්ගේ ඇඳුම් පැළඳුම් සම්බන්ධයෙන්ද සමාජ මාධ්‍ය තුළ ජාතිවාදී ප්‍රචාර පතුරුවා හැරුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉස්ලාමීය ඇඳුම භාවිතයට තෝරා ගත් මුස්ලිම් කාන්තාවන්ගේ ආරක්ෂාව අඩු විය. හදිසි නීතිය ඉවත් කර ඇතත් මුස්ලිම් කාන්තාවන් තමන් තෝරා ගත් ඇඳුම භාවිතය නිසා දිගින් දිගටම හිරිහැර වලට ලක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ කාන්තාවන් සංචරණය සඳහා ඔවුන්ගේ මුහුණු ආවරණ සහ හිස් ආවරණ ඉවත් කිරීමට තීරණය කලහ. 2019 මැයි 29 වැනි දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය චක්‍ර ලේඛයක් නිකුත් කරමින් කාන්තා රාජ්‍ය නිලධාරිනියන්ට රාජකාරිය සඳහා සාරිය පමණක් අඳින ලෙස ඉල්ලා සිටි අතර, මුස්ලිම් කාන්තා නිලධාරිනියන් හට අබායා හෝ නිකාබ් හෝ අඩු තරමින් හිසේ සාලුව සහිත සල්වා ඇඳුම ඇඳීම පවා තහනම් කලේය. මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර ගණනාවකදී කළ පැමිණිලි වලට අනුව මෙම චක්‍ර ලේඛය ඉවත් කෙරුනත් මුස්ලිම් කාන්තා නිලධාරීන්ට දිගින් දිගටම අපහසුතාවයනට මුහුණ දීමට සිදු වූ අතර සමහර අය රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස් වූහ (පහත විස්තරාත්මකව දක්වා ඇත).

2020 වසරේ ජූනි මස 2 වැනි දින, ගැසට් අංක 2178/17 මගින් නැගෙනහිර පළාතේ පුරා විද්‍යා කළමනාකරණය සඳහා වූ කාර්ය සාධක බලකායක් ආරම්භ කරන ලදී. බෞද්ධ උරුමයන් සුරැකීමේ මුවාවෙන්, අම්පාර ප්‍රදේශයේ ඉඩම් මනින කාර්ය සාධක බලකාය, ස්වකීය ඉඩම් සඳහා වලංගු ඔප්පු ඇති මුස්ලිම් පවුල් 300ක් පමණ ඉවත් කිරීමට ආසන්නව සිටී. මෙම සිංහල පුරුෂයන් පමණක් සිටිනා කාර්ය සාධක බලකායට පුරා විද්‍යාඥයන් පමණක් නොව, භික්ෂූන් වහන්සේලා සහ හමුදා නිලධාරීන් ද ඇතුලත් වේ. අම්පාර මුස්ලිම් වාසීන් බහුතර ප්‍රදේශයක් වන අතර, කාර්ය සාධක බලකාය හිතාමතාම එම පළාතේ බහු වාර්ගික අනන්‍යතාවය හෑල්ලුවට ලක් කරමින් මුස්ලිම් සහ ද්‍රවිඩ ප්‍රජාවන්ගේ ඉඩම් උදුරා ගැනීමට සහ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයටද බාධා කිරීමට උත්සාහ දරයි.[1]

1 Input to the Report on Anti-Muslim Hatred and Discrimination by Alliance for Minorities (a collective of 08 Civil Society

කෝවිඩ් වසංගත තත්වය හේතුවෙන්ද මුස්ලිම් ප්‍රජාව නව උරුවකින් යුත් වෙනස් කොට සැළකීමකට මුහුණ දුන්හ. ප්‍රධාන ධාරාවේ මාධ්‍ය වල පවා මුස්ලිම්වරුන් කෝවිඩ් වාහකයන් සහ පතුරුවන්නන් ලෙස නිරූපණය කරමින් ලිපි පල වී ඇත. බරපතල කෝවිඩ් 19 ආසාදිත රෝගීන්ට ප්‍රතිකාර කරන එක්තරා රෝහලක ප්‍රධානියා වන අධිකරණ වෛද්‍ය නිළධාරීවරයෙකු අදහස් දක්වමින් කියා සිටියේ මුස්ලිම්වරුන්ට භූමදානය කිරීමේ විකල්පය ලබා දෙන්නේ නම්, කෝවිඩ් 19 මල සිරුරු ජීව විද්‍යාත්මක ආයුධ ලෙස භාවිත කිරීමට ඉඩ ඇති බවයි.[2] එහි ප්‍රතිඵලයක් ලෙස කෝවිඩ් හා කෝවිඩ් යැයි සැක සහිත මුස්ලිම් මළසිරුරු 300කට අධික ප්‍රමාණයක් බලහත්කාරයෙන් ආදාහනය කරන ලදී. ගෝලීය විරෝධය නොතකා,[3] බලහත්කාරයෙන් ආදාහන කිරීමේ ප්‍රතිපත්තිය 2022 මාර්තු වන තෙක් සම්පූර්ණයෙන්ම ඉවත් කෙරුණේ නැත.

2019 පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත (*PTA*), අනිසි ලෙස යොදා ගනිමින් මුස්ලිම්වරුන්ට එරෙහිව දැඩි ලෙස භාවිත විය. මේ ප්‍රවණතාව වෙනස් කරනවා වෙනුවට වත්මන් රජය උත්සාහ කරනුයේ ඊටත් වඩා දරුණු ත්‍රස්ත විරෝධී පණතක් ගෙන ඒමටය. මුස්ලිම් ප්‍රජාව මෙහිදී කනස්සල්ලට පත්ව සිටිනුයේ මෙකී ප්‍රති-ත්‍රස්ත පණත (*ATA*) සැලසුම් කොට ඇත්තේ රට තුල *ISIS* ක්‍රියාත්මක වන බවට විශ්වාස කෙරෙන පසුබිමක හා ජාතික ආරක්ෂාව සහ ස්වෛරීභාවය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය පදනම් කොට ගෙන වීමය. යෝජිත නීතිය කෙතරම් පුළුල්ද යත් එකී විධිවිධානයන්ට අනුව ඉස්ලාම භීතිකාවට හෝ ද්වේශ සහගතව කටයුතු කිරීමට එරෙහි වන ඕනෑම මුස්ලිම්වරයෙකුව හෝ වෙනත් ඕනෑම සුළුතර ප්‍රජාවක අයෙකුව ත්‍රස්තවාදියෙකු ලෙස ලේබල් කිරීමට හැකි වේ. මෙය පදනම් විරහිත කාරණයක් නොවන බවට උදාහරණ ලෙස ප්‍රතිසංස්කරණ සඳහා නැමියාවක් ඇති මුස්ලිම් ප්‍රජා ක්‍රියාකාරීන්ට එරෙහිව ත්‍රස්තවාදය වැලක්වීමේ පණතෙහි හා සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳව අන්තර්ජාතික ප්‍රඥප්තියෙහි (*ICCPR*) බලතල අනිසි ලෙස යොදා ගත් අවස්ථා දැක්විය හැක.

අවාසනාවන්ත ලෙස වහාබ්වාදය වර්ධනය වීමත් සමඟ මුස්ලිම්වරුන් අතර ද කොන් කිරීම්, නින්දා අපහාස වලට ලක් කිරීම් වැනි දේ දක්නට ඇති අතර, එම චින්තනයට නොගැළපෙන ඕනෑම අයෙකු අපකීර්තියට, පහර දීමට, ප්‍රතික්ෂේප කිරීමට හෝ නෙරපා හැරීමකට ලක් වේ. සමහර පුද්ගලයන්ට දරුණු ලෙස පහර දෙනු ලබනුයේ මුස්ලිම්වරුන්ම විසිනි (විශේෂයෙන් ශාෆි චින්තන ගුරුකුලය ප්‍රවර්ධනය කරන අය). සමස්ත ලංකා ජම්මියාතුල් උලේමා වැනි ප්‍රමුඛ පෙලේ දේවධර්මවාදී කණ්ඩායම් විසින් රැඩිකල්, පසුගාමී හෝ නොගැළපෙන භාවිතාවන් පෝෂණය කරනු ලැබේ. ප්‍රජාව තුල සිදු වන ඕනෑම ප්‍රගතිශීලී ප්‍රතිසංස්කරණ කටයුත්තක් සඳහා විශේෂයෙන් කාන්තා ලිංගික ඡේදනය ඉවත් කිරීම, මද්‍රසා අධ්‍යපනය සහ මුස්ලිම් විවාහ කටයුතු පාලනය වන යල්පිනූ නීතිය වන මුස්ලිම් විවාහ හා දික්කසාද පණත (*MMDA*) ප්‍රතිසංස්කරණය කිරීම වැනි කාරණා වලදී මෙම උලේමාවරුන් බරපතල බාධාවක් වී ඇත. මුස්ලිම් කාන්තා කණ්ඩායම් වසර 40 කට වැඩි කාලයක් තිස්සේ මුස්ලිම් කාන්තාවන්ගේ හා ගැහැණු ළමුන්ගේ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් මෙම *MMDA* ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කටයුතු කොට ඇත. නමුත් ස්ත්‍රී විරෝධී පූජකයින් හා

---

Organisations from North and East)

2 The Leader, 'Small fear whether the dead bodies with the virus can be used as biological weapons - Dr. Channa Perera tells BBC' 16th April 2020, https://english.theleader.lk/news/690-small-fear-whether-the-dead-bodies-with-the-virus-can-be-used-as-biological-weapons-dr-channa-perera-tells-bbc

3 OHCHR, 'Sri Lanka: Compulsory cremation of COVID-19 bodies cannot continue, say UN experts', 25th January 2021, https://www.ohchr.org/en/press-releases/2021/01/sri-lanka-compulsory-cremation-covid-19-bodies-cannot-continue-say-un

ප්‍රජා නායකයින් විසින් ඔවුන් ඉස්ලාම් ධර්මයට පටහැනි යැයි හංවඩු ගසා අපකීර්තියට පත් කරනු ලබයි. ඉස්ලාම භීතිකාව සමඟ ඔවුන්ගේ වැඩ කටයුතු වඩාත් දුෂ්කර භාවයට පත් වී ඇති අතර මුස්ලිම් ප්‍රජාව අතර ද වාර්ගික සහයෝගිතාවයේ අත්‍යාවශ්‍ය භාවය තව දුරටත් වර්ධනය වෙමින් පවතී.

# ස්ත්‍රී පුරුෂ භාවය සහ අන්තර් ගැටීම්, FORB උල්ලංඝනයන් පිළිබඳ හැඳින්වීම

2009 වසරේ 26 වසරක යුද්ධය නිමා වීමෙන් පසුව, ශ්‍රී ලංකා රාජ්‍යය වින්දිත ප්‍රජාවන් කෙරෙහි කිසිදු ආකාරයකින් හෝ වගවීම වැළැක්වීමේ උපාය මාර්ගයක් ලෙස, සෑම ප්‍රජාවක් තුලම ආගමික අන්තවාදය ප්‍රසිද්ධියේ සහ රහසිගතව පෝෂණය කරනු ලැබ ඇත. මේ ආකාරයට අනුප්‍රාප්තික ආණ්ඩු, අපරාධකරුවන් ඕනෑම අන්දමේ නඩු පැවරීමකින් වළක්වා ගැනීමට හැකි වන පරිදි බලතල සහිත ධුරයන්හි තබා ගනී. අනිකුත් සෑම කාරණයකදී සේම ආගමික අන්තවාදයේදී ද ලිංගිකත්වය මත වාසි ලබා ගැනීම සිදු වන අතර ස්ත්‍රිය, වෛරය ප්‍රචාරණය කිරීමේ මෙවලමක් සේ භාවිත කෙරේ.

නැගෙනහිර ප්‍රදේශයේ 'ශිව සේනා' ව්‍යපාරයේ වර්ධනය ගැන පැමිණිලි ඉදිරිපත් කරමින් කාන්තා කණ්ඩායම් කියා සිටියේ මෙම ව්‍යාපාරයට අවශ්‍ය වී ඇත්තේ හින්දු කාන්තාවන් ශිව දෙවියන්ට වැඩි වැඩියෙන් භක්තිමත් වීම හා ඔවුන් ලවා මුස්ලිම් විරෝධී හැඟීම් පැතිර වීම බවයි. මුස්ලිම් කාන්තාවන් අනිකුත් ආගමික ප්‍රජාවන්ගෙන් බැහැර කර ඔවුන්ගේ සංචරණය හා ආශ්‍රය කිරීම් පාලනයට හා අධීක්ෂණයට ලක් වන ආකාරයෙන් මුස්ලිම් ප්‍රජාව තුල ද ආගමිකත්වය වර්ධනය වී ඇති බවට කාන්තා කණ්ඩායම් වල වාර්තා අනාවරණය කළේය. ක්‍රිස්තියානි ප්‍රජාවට එල්ල වන ප්‍රහාර වැඩි වීම නිසා කාන්තා දේවගැතිවරියන් ආගමික දේශනා කිරීම් වලට සම්බන්ධ වීම සහ ප්‍රජා සේවයේ සක්‍රියව දායක වීම කෙරෙහි පීඩනයක් ඇති කර තිබේ. අනෙක් අතට වර්තමානයේ, උතුරේ සහ නැගෙනහිර මිලිටරීකරණය වෙමින් පවතින ප්‍රදේශවල වරින් වර, බලහත්කාරයෙන් ඉදි කළ බෞද්ධ සිද්ධස්ථාන කරා වන්දනාවේ යන තත්වයට සිංහල කාන්තාවන් ද ඇද දමා ඇති බව පෙනේ.

කාන්තාවන් අතර සමාගමයෙන් හා චාරිත්‍ර වාරිත්‍ර හරහා ආගමික භක්තිය ප්‍රවර්ධනය කරනු ලබයි. ඔවුන්ගේ ශරීර, ඇඳුම් පැළඳුම් සහ ප්‍රජනන හැකියාව, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ හා පශ්චාත් පාස්කු ප්‍රහාර සන්දර්භය තුල වර්ධනය වන ආගමික අනන්‍යතා දේශපාලනයේ කේන්ද්‍රීය වී ඇත. නැගෙනහිර පළාතේ මුස්ලිම් ජාතික පුද්ගලයින්ට, ද්‍රවිඩ තරුණියන් පැහැර ගෙන ගොස් විවාහ කර ගන්නා බවට චෝදනා කරති. එවැනි කට කතා දෙමළ හා මුස්ලිම් යන සුළුතර ප්‍රජාවන් අතර ආතතීන් උත්සන්න කරයි. මේ තත්වය ප්‍රජා සීමාවන්ගෙන් ඔබ්බට ගොස් ආලය කරන්නන් සේම, විවාහ වන්නන් ද කොන් කරනු ලබයි. 2021 දෙසැම්බර් මස 6 වැනි දින මඩකලපුවේ සංචාරයක යෙදෙන අතරතුර 'එක රටක් - එක නීතියක්' කාර්ය සාධක බලකායේ සභාපති (ජනාධිපති සමාව ලැබූ අධිකරණයෙන් වරදකරු කරන ලද ඥානසාර හිමි), ප්‍රකාශ කලේ මුස්ලිම් හා ක්‍රිස්තියානිවරුන් විසින් හින්දූන් තම ආගම්වලට හරවන බවට තමන් වෙත විශ්වාසදායක පැමිණිලි ලැබී ඇති බවයි.[4]

---

4 Newswire, ''One Country, One Law' receives warm response from East – PMD (Video)', 6th December 2021, https://www.newswire.lk/2021/12/06/one-country-one-law-receives-warm-response-from-east-pmd-video/

සෑම විපතකදීම කාන්තාවන් අසමානුපාතික ලෙස පීඩාවට පත් වේ. ශ්‍රී ලංකාවේ වාර්ගික හා ආගමික ගැටුම් වල තත්ත්වයද ඊට වෙනස් නොවේ. පශ්චාත් යුධ සන්දර්භය තුල ද්‍රවිඩ කාන්තාවන්ට රාජ්‍යය හෝ සටන් කරුවන් විසින් අතුරුදන් කර දැමූ තම පවුල් සාමාජිකයන් සොයා යාමට සිදු වූ අතර ඔවුන් ආපසු එන විට බොහෝ විට දැඩි ලෙස මිලිටරීකරණය වූ පරිසරයක් තුල ඔවුන්ගේ නිවෙස් කඩා බිඳ දමා තිබුණි. රජය මගින් පසුව සැපයූ සීමිත ආධාර මගින් ඔවුනට ඒවා නැවත ගොඩ නගා ගැනීමට සිදු විය. 2019 පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පශ්චාත් සමයේ ද මුස්ලිම් කාන්තාවන්ට ඔවුන්ගේ ආගමානුකූල ඇඳුම ඇඳීමට ඇති අයිතිය, පොදු ස්ථාන වලදී ආරක්ෂාව, ප්‍රසිද්ධියේ ගමන් බිමන් යාම සහ ඇසුරු කිරීමේ නිදහස වෙනුවෙන් සටන් කිරීමට සිදු විය. ඔවුන් ද කුරිරු ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ ඉලක්ක බවට පත් වූ අතර අද ඔවුන් බොහෝ දෙනෙක් තම පවුලේ සාමාජිකයන් (බොහෝ විට පිරිමින්) රාජ්‍ය රඳවා තබා ගැනීම් වලින් හා පරීක්ෂණ වලින් නිදහස් කර ගැනීමට උත්සාහ කරති.

මඩකලපුවේ හින්දු කාන්තාවන්, පාස්කු ප්‍රහාර වලින් පසුව තම ප්‍රජාව තුල ආගමික නැම්යාව වැඩි වී ඇති බවත් විශේෂයෙන්ම ආගමික වත් පිළිවෙත් වලදී කාන්තාවන් හට පැවරෙන දායකත්වය වැඩි වී ඇති බවත් තහවුරු කොට ඇත. ඔවුන් විශ්වාස කරනුයේ මෙම භාවිතයන්ට තාර්කික පදනමක් නොමැති බවත් ඒවා *RSS (රාෂ්ට්‍රීයා ස්වයම්සේවක් සංග්)* බලපෑමේ ප්‍රතිඵල බවත්ය. උදාහරණයක් ලෙස නිරාහාර උපවාසය සඳහා පිළිපැදිය යුතු බොහෝ කාරණා හඳුන්වා දී ඇති අතර (විරදම්), ඒවා පිළිපැදීම සඳහා සැළකිය යුතු අන්දමින් කැප කිරීම් කළ යුතුව ඇතත් ඉන් ලැබෙන ප්‍රතිලාභයන් පිලිබඳව පැහැදිලි අවබෝධයක් ද නැත. ඉස්ලාමීය අන්තවාදීන් මඩකලපුවේ සියොන් දේවස්ථානට බෝම්බ ප්‍රහාර එල්ල කිරීමෙන් පසු විශේෂයෙන් වර්ධනය වන මුස්ලිම් විරෝධී ආකල්ප සමඟ සමහර ආගමික පුද්ගලයින් හා ආයතන වල උත්සාහයන් වනුයේ මුස්ලිම් හා හින්දු ප්‍රජාවන් ද්විත්වයෙහිම කාන්තාවන්ගේ ශරීරය සහ මනස පාලනය කිරීම සඳහා ආගම මෙවලමක් සේ භාවිතා කරමින් කාන්තාවන්ගේ පාරිශුද්ධත්වය පවත්වා ගැනීම ඇතුළුව සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාවී භූමිකාවන්ට අනුගත වීමට කාන්තාවන් පෙලඹවීමයි. මේ ප්‍රයත්නයන්හි ප්‍රතිඵලය ලෙස දැකිය හැකි වනුයේ කාන්තාවන් එකිනෙකාට එරෙහි වීම හා ඔවුන් අතර භේද ඇවිලවීම පමණි.

එක් ප්‍රමුඛ පෙළේ ක්‍රියාකාරිකයෙක් ප්‍රකාශ කළේ “බොහෝ සයිව ජනයා තම වටපිටාව ගැන වඩාත් ප්‍රවේශම් සහගත හා සැක සහිත බවට පත් වී ඇත. අවාසනාවකට ආපන ශාලා වල පිරි නමන ආහාර වල වන්ධ්‍යාකරණ ඖෂධ පිළිබඳ පැතිරුණු කට කතා වැනි දෑ මුස්ලිම් වෙළෙන්දන් පිටු දැකීම හා ඔවුන් පිළිබඳව පසුපසින් සිට නොදැනෙන සේ කතා කිරීම වැනි සමහර සෘණාත්මක හැසිරීම් වලට තුඩු දී ඇත. මඩකලපුවේ පාසලක දෙමාපිය ගුරු හමුවක් අතරතුරදී පවා අබායා හැඳ ගත් දෙමාපියකු පැමිණි විට ඇතැම් සයිව ජනයා ඊට නිෂේධාත්මක ප්‍රතිචාර දැක්වූහ. මේ ප්‍රතිචාර දක්වන ලදුයේ වැඩි සිතා බැලීමකින් හෝ සැළකිල්ලකින් තොරවය”.

නැගෙනහිර පළාතේ කාන්තා ක්‍රියාකාරිනියන් එවැනි හැසිරීම් ගැන කණස්සල්ලට පත් වන අතර ඔවුන් එය දකිනුයේ සාධාරණීකරණය කළ නොහැක්කක් හා විරෝධ ආකල්ප සහිත ප්‍රතිඵලයක් ගෙන දෙන්නක් ලෙසය. ඔවුන්ගේ අදහසට අනුව මෙවන් භාවිතයන් නිසා ප්‍රජාවන් අතර විශ්වාසය පළුදුවීම් මෙන්ම තවදුරටත් බෙදීයාම් ඇති විය හැකි අතර අවසානයේ සහභාගි වූ සියල්ලන් හටම එය හානිකර වනු ඇත. එමෙන්ම ඔවුන් දැරූ මතය වූයේ විවිධ ආගමික හා විවිධ ජනවාර්ගික කණ්ඩායම් අතර ඉවසීමෙන් හා මනා අවබෝධයකින් යුතුව කටයුතු කිරීම ප්‍රවර්ධනය කළයුතු වනවා මෙන්ම විශේෂයෙන්ම අර්බුදකාරී තත්වයකදී එය ප්‍රමුඛත්වය දැක් විය යුතු කාරණයක් ද වන බවයි.

මෙම පත්‍රිකාව ඉදිරිපත් කෙරෙනුයේ ද ශ්‍රී ලංකාව තුල ආගමික අපහාස යැයි අර්ථ දැක්වෙන ප්‍රකාශ යටතේ අත් අඩංගුවට ගැනීම් පෙළක් සිදු වෙමින් පවතින වකවානුවක් අතරතුරදීය. ප්‍රහසන ශිල්පිනී නතාශා එදිරිසූරිය සහ යූ ටියුබ් නාලිකාවක් පවත්වාගෙන යන බෲනෝ දිවාකර සතියක කාලයක් ඇතුලත අත් අඩංගුවට ගෙන සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ (*ICCPR*), තුන්වන වගන්තිය යටතේ රිමාන්ඩ් භාරයට පත් කරන ලදී.[5] මේ වසර මුලදී තවත් සමාජ මාධ්‍ය ක්‍රියාකාරිකයෙකු වූ සේපාල් අමරසිංහ නමැති අය අත්අඩංගුවට ගනු ලැබුවේ ද මෙම හේතුව නිසාය. ඉවැන්ජලික කිතුනු දේශකයෙකු වන දේවගැති ජෙරම් ප්‍රනාන්දු ද ඔහුගේ දේශණා වලදී පල කළ අදහස් සම්බන්ධයෙන් මත භේදයට තුඩු දී ඇති අතර දැනට අත්අඩංගුවට ගැනීම් මග හැර විදේශ ගතව සැඟවී සිටියි.

මේ සියලු දෙනාටම පොදු සේ සැළකිය හැකි එක් කාරණයක් වේ. එනම් ඔවුන් බුදු දහමට අපහස කරමින් ප්‍රචණ්ඩත්වය අවුළුවාලීමේ චෝදනාවට ලක් වී ඇත. ශ්‍රී ලංකාවේ බහුතරයකගේ ආගම වන බුද්ධාගම රටේ ප්‍රමුඛතම ආගම ලෙසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා ඇති අතර එම ආගමට ආරක්ෂාව සපයන වේශයෙන් *ICCPR* අනිසි ලෙස භාවිත කිරීමේ ප්‍රවණතාවක් රට තුල බිහි කර ඇත. බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍ය විදුර වික්‍රමනායක මහතා, 2023 මැයි මස 28 වැනි දින ප්‍රකාශ කළේ ශ්‍රී ලංකාවේ ආගමික සහජීවනය ප්‍රවර්ධනය කිරීම සඳහා සියලුම ආගමික ආයතන රජය සමග ලියාපදිංචි විය යුතු නව නීතියක් සම්පාදනය කරන බවයි. මේ මගින් රජයට ආගමික කටයුතු නිරීක්ෂණය කිරීමටත් අවශ්‍ය නම් ආගමික ගැටුම් ඇතිවීම වැළැක්වීමට මැදිහත් වීමටත් ඉඩකඩ සැලසේ. අමාත්‍යවරයා තව දුරටත් කියා සිටියේ ආගමික ආයතන ලියාපදිංචි කිරීමෙන් ශ්‍රී ලංකාවේ ආගමික භූ දර්ශනය වඩාත් හොඳින් අවබෝධ කර ගැනීමට රජයට හැකිවන බවය. 2023 මැයි මස 30 වැනි දින ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා විසින් ආගමික සහජීවනයට බාධා කරන කණ්ඩායම් පිළිබඳව සොයා බලා වහාම ක්‍රියාත්මක වීමට විශේෂ පොලිස් ඒකකයක් පිහිටුවන ලදී. නව පොලිස් ඒකකය වෙත 'කඩාකප්පල්කාරී ක්‍රියා' වලට එරෙහිව ක්‍රියාත්මක වීමට සහ ආගමික සහජීවනයට බාධා පමුණුවන ප්‍රයත්නයන් පුළුල් සමාජයට පැමිණීමට පෙර, වැළැක්වීමේ වගකීම පැවරෙනු ඇත. මෙම ප්‍රතිපත්ති ආගමික හා සංස්කෘතික ප්‍රතිපත්ති සම්පාදනය දිරිමත් කරන අතර ආගමික මත ගැටුම් අවුළුවාලීම මගින් ප්‍රජාවන් එකිනෙකාට එරෙහි වීමට පොළඹවනු ලබයි.

මෙම පසුබිමට එරෙහිව මෙම වාර්තාව මගින්, මුස්ලිම් කාන්තාවට සැළකෙන ආකාරය පිළිබඳව සුවිශේෂී අවධානයක් යොමු කරමින් ආගමික ප්‍රචණ්ඩත්වයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහසට ඇති සීමාවන් විශ්ලේෂණය කරනු ඇත.

---

5 2007 දී සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය ශ්‍රී ලංකාව විසින් සම්මත කරන ලදී. ICCPR යනු යුරෝපා සංගමයේ වෙළඳ යෝජනා ක්‍රමයේ (GSP+) මූලික සම්මුති වලින් එකක් වන අතර දේශපාලන නිරීක්ෂකයින් තර්ක කරනුයේ GSP+ සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකාව දේශීයකරණය වූ ICCPR පණත පනවන ලද බවයි. පණතේ භාෂාව මූලික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ආරක්ෂා කරන නමුදු, දේශීයකරණය වූ ICCPR පණතේ 3 වැනි වගන්තිය භාවිතා කරමින් බහුතරයේ හැඟීම් වලට බාධා කිරීමේ චෝදනාවට ලක්වන සුළු ජාතීන් සහ විරුද්ධවාදීන් අත්අඩංගුවට ගැනීම සිදු කරනු ලබයි. වර්තමානයේදී රජය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට ආදේශකයක් වශයෙන් ICCPR පනත යොදා ගනිමින් සිටියි. මෙයට හේතු වී ඇත්තේ ජාත්‍යන්තර ප්‍රජාව මගින් (ප්‍රධාන වශයෙන් යුරෝපා සංගමය) එල්ල කරන ලද පීඩනය හමුවේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත ක්‍රියාත්මක කිරීම තාවකාලිකව අත්හිටුවීමට රජය කටයුතු කිරීමයි.

# ශ්‍රී ලංකාවේ පාස්කු බෝම්බ ප්‍රහාරයෙන් මුස්ලිම් කාන්තාවන් කෙරෙහි වන බලපෑම

විනාශකාරී 2019 පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව, රජය විසින් මුස්ලිම් ප්‍රජාවට එරෙහිව මහජනයාගේ හැඟීම් අවුස්සවනු ලැබීය. මෙසේ සිදු වූයේ, මුස්ලිම් ප්‍රජා ක්‍රියාකාරීන් වසර ගණනාවක් තිස්සේ ප්‍රධාන මරාගෙන මැරෙන බෝම්බකරු පිළිබඳව සහ ඔහුගේ වෛරී ප්‍රකාශනයන්හි ගොදුරු බවට තමන් පත් වන බවට බලධාරීන්ට අනතුරු අඟවා තිබෙන ලද පසුබිමකය. වින්දිතයින්ට යුක්තිය ඉටු කිරීම හෝ තමන්ගේම ආරක්ෂක පද්ධතියේ සිදු වූ අක්‍රමිකතා පැහැදිලි කිරීමට වඩා සමස්ත මුස්ලිම් ප්‍රජාවම ඉලක්ක කර ගැනීම රජයට පහසු වූවා විය හැකිය. මෙම ප්‍රවණතාවයන් පිලිබඳව පුළුල් ලෙස සාකච්චා කරන අතරතුර,[6] මෙම ලිපිය, විශේෂයෙන්ම ලිංගිකත්වය පදනම් කොට ගෙන සිදු වන ආගමික වෙනස් කොට සැළකීම් කෙරෙහි පහත සිද්ධි අධ්‍යයනයන් පාදක කර ගනිමින් අවධානයට ලක් කෙරේ.

1) **මුස්ලිම් කාන්තාවන්ගේ ඇඳුම පිළිබඳ චක්‍ර ලේඛය;**

පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් අනතුරුව 2019 මැයි මස 29 වැනි දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් චක්‍රලේඛයක් නිකුත් කරන ලද අතර ඊට අනුව සියලුම රාජ්‍ය සේවිකාවන්, ශ්‍රී ලංකාවේ බහුතරයක් කාන්තාවන් විසින් අඳිනු ලබන සාම්ප්‍රදායික ඇඳුමක් වන සාරිය[7] පමණක් ඇඳිය යුතු බවට නියම කරන ලද අතරම මුස්ලිම් කාන්තාවන් හට අබායා, නිකාබ් හෝ හිස ආවරණය කොට සල්වා ඇඳුම හෝ ඇඳීම තහනම් කරන ලදී. බොහෝ මුස්ලිම් කාන්තාවන් මෙම ඇඳුම, ආගමික වශයෙන් නියමිත වූවක් ලෙස සළකන බැවින් එම චක්‍රලේඛය ඔවුන්ගේ ලිංගික සමානත්මතාවය සහ ආගමික නිදහස යන කාරණා ද්විත්වයම උල්ලංඝනය කෙරෙන්නක් විය.

ලිංගික සමානත්මතාවය යනු ස්ත්‍රී පුරුෂ හෝ වෙනත් ලිංගිකභාවයන් නොසළකා සියළුම පුද්ගලයින් හට සමාන අයිතිවාසිකම්, අවස්ථා හා සැළකීම් භුක්ති විඳීමට ඉඩ කඩ සැලසීමයි. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය, ලිංගික සමානාත්මතා නීති/ ප්‍රමිතීන්/ සම්මතයන් උල්ලංඝනය කිරීමක් වනුයේ, එය මගින් නිශ්චිත ඇඳුම් පැළඳුම් සඳහා කේතයක් පැනවෙනු ලැබීම හේතුවෙන් කාන්තාවන් හට ඔවුන්ගේ සංස්කෘතියට හා ආගමට අනුකූල වන වස්ත්‍රයකින් සැරසීමේ නිදහස ප්‍රතික්ෂේප කරනු ලබන බැවිනි. මෙය ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සීමා කරනවා පමණක් නොව එමගින් ඔවුන් ආගමික, සංස්කෘතික හා ලිංගිකත්වය පදනම් කොට ගත් වෙනස් කොට සැළකීමට භාජනය කරනු ලබයි. මෙය සුවිශේෂී ලෙස අවාසිදායක වනුයේ මුස්ලිම් කාන්තාවනටය. එමෙන්ම එමගින් මුස්ලිම් පුරුෂයින්ට හෝ වෙනත් ආගම් අදහන හා වෙනත් සංස්කෘතීන්ට අයත් කාන්තාවන්ටද බලපෑමක් ඇති නොවේ. මෙහි බලපෑමට ලක් වූ රාජ්‍ය සේවිකාවන් අදහස් බෙදා ගනිමින් පැවසුවේ මෙම චක්‍රලේඛයෙහි වෙනසක් ඇති කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ නිළධාරීන් සමග සාකච්ඡා කිරීම සඳහා සහභාගි නොවී හිඳීමට මුස්ලිම් පුරුෂයින් වඩා කැමති වූ බවත්, ඔවුන් එය නොකර සිටියේ එසේ සහභාගි වුවහොත් ඔවුනට එරෙහි විනය ක්‍රියාමාර්ගයන් ගනු ඇතැයි බිය වූ නිසා බවත් පැවසුහ.

6 Shreen Saroor and Mytili Bala, Terrorising Minorities through Counterterrorism (October 2022), in Muslims in Post-War Sri Lanka, https://www.minormatters.org/storage/app/uploads/public/615/69b/d3b/61569bd3b3d59076872669.pdf.

7 Colombo Telegraph, 'Ministry Of Public Administration To Stop Female Public Servants Wearing Abaya?', 31st May 2019, https://www.colombotelegraph.com/index.php/ministry-of-public-administration-to-stop-female-public-servants-wearing-abaya/

ආගමික නිදහස යනු රාජ්‍ය මැදිහත් වීමකින් තොරව පුද්ගලයින් හට තම ආගම ඇදහීමට ඉඩ සලසන මූලික මානව අයිතිවාසිකමකි. එම නිසා චක්‍රලේඛය මගින් මුස්ලිම් කාන්තාවන්ට තම ආගම ඇදහීමට හෝ තම ආගමික අනන්‍යතාවය විවෘතව ප්‍රකාශ කිරීමට බාධා එල්ල කරනු ලැබ ඇත.

## 2) ත්‍රස්ත විරෝධී නීතිය අවභාවිත කිරීම හා කාන්තාව

දෙමළ ජනතාව ඉලක්ක කර ගැනීම උදෙසා ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත අවභාවිතා කිරීම පිළිබඳව දීර්ඝ ඉතිහාසයක් ශ්‍රී ලංකාවට ඇත. සිවිල් යුද්ධය පැවති කාලය තුල පීඩාවට පත් කිරීමේ මූලික මෙවලම එය විය. යුද්ධය අවසන් වීමෙන් පසු රාජ්‍යය, තම ඉලක්කය වෙනස් කොට සමස්ත මුස්ලිම් ප්‍රජාවම මර්ධනය කිරීමට ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත භාවිතා කර ඇති අතර, පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ සැබෑ අපරාධකරුවන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී ඇත. ත්‍රස්තවාදය වැළැක්වීමේ පණතට අනුව අත්අඩංගුවට ගෙන රඳවා තබා හිඳින්නන්, ඇපකර හානිය නිසා හෝ ඔවුන්ගේ පවුල් හා සමග ඇති සබඳතා නිසා රජය මගින් සිදු කරනු ලබන උපක්‍රමශීලී මග හැර යාමේ හේතුවෙන් කාන්තාවන් විශේෂිතව මෙහි ගොදුරු බවට පත් වී ඇත. "ග්‍රවුන්ඩ්වීව්ස්"[8] නම් ස්වාධීන පුරවැසියන්ගේ සඟරාවේ පළ වූ ලිපියක් මගින් පෙන්වා දෙන පරිදි බොහෝ රැඳවියන් දුප්පත් පිරිමින් වන අතර මරා ගෙන මැරෙන බෝම්බ කරුවන් හා සබඳකම් පැවැත් වූ බවට සැක සහිත අයවලුන් වේ. මොවුන් අතර නොදැනුවත්ව ඔවුන්ගේ දේශන වලට සහභාගි වූවන් හෝ මරාගෙන මැරෙන බෝම්බ කරුවකුගේ අසල් වැසි ප්‍රදේශයක ඇන්ටෙනාවක් සවි කළ අයෙකු හෝ සමහර විටෙක ජාතික තවුහිත් ජමාත් දේශන වලට ආහාර ලබා දුන් අයවලුන් ද සිටියි.

එමෙන්ම එකී ලිපිය මගින් දක්වන ලද කරුණු වලට අනුව නිසි චෝදනාවකින් තොරව රඳවා තබා ගෙන හුන් මෙම පුද්ගලයින්ගේ රැඳවුම් නියෝග අත්හිටුවීමේදී වුවද ඔවුන් හට දැඩි කොන්දේසි පණවා ඇත. එනම් ත්‍රස්ත මර්ධන හා විමර්ශන අංශයට මාසිකව වාර්තා කිරීම, ඕනෑම විදේශගත වීමකදී ත්‍රස්ත මර්ධන හා විමර්ශන අංශයේ අධ්‍යක්ෂවරයාගෙන් පූර්ව ලිඛිත අවසරයක් ලබා ගැනීම, පැය 72ක දැනුම් දීමක් ඇතුලත ස්ථාන භාර නිලධාරීවරයා වෙත වාර්තා කිරීම යන කරුණු ඒ අතර වේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ මෑත කාලීනව අත් අඩංගුවට ගෙන රඳවා තබා ගෙන ඇති පුද්ගලයින් අති බහුතරයක් මාස 34 කට අධික කාලයක් සිර කර තබා ඇති අතර, මෙය අදාල පණත යටතේ අවසර දී ඇති මාස 18 ට වඩා දීර්ඝ කාලයකි. රජය විසින් නිසි වගකීම් වලින් මග හැර සිටීම නිසා මෙන්ම රැඳවියන්ගේ පවුල් හා බැඳී පවතින සබඳතා නිසා ස්වීය පාර්ශවටද සිදු විය හැකි හානි වලින් වැළකී සිටීමට උත්සාහ දරණ නිසාද කාන්තාවන් සුවිශේෂව මෙකී ව්‍යසනයට ගොදුරු වී ඇත. මොවුන් මුහුණදෙන අසීරුතාවය බෙහෙවින්ම කණගාටුදායක වනුයේ පීතෘ මූලික සමාජයක පවුලේ ආදායම උපයන්නන් රජය මගින් රඳවා තබාගෙන ඇති හෙයිනි. මෙම අත්තනෝමතික සමූහ රැඳවුම් වල බර ද කාන්තාවට දැරීමට සිදු වනුයේ මුදල් උපයන්නා රඳවා තබා ඇති විට එම කාර්යයටද ඇයට උර දීමට සිදුව ඇති බැවිනි. ආරක්ෂක අංශ විසින් ඔවුන් මුණගැසීමට ගොස් පොලිස් ස්ථානයට කැඳවනු ලබන අතර, ඇතැමුන් ජීවිකාව ගෙනයාම සඳහා වටිනා ද්‍රව්‍ය, ගෘහ භාණ්ඩ වැනි දෑ විකුණා ඇති බවට වාර්තා ලැබ ඇත. කතුවරයා විසින් ඉදිරිපත් කොට ඇති ආකාරයට තම ආදරණීයයෙකු රඳවා තබා ගැනීමට මුහුණ පෑම නිසා ඔවුන් ප්‍රජා වාරණයකටද ලක් වන අතර දැනටමත් කොන් කර ඇති

8 Groundviews, 'The Tragic Lives of Women Victims of the PTA', 2nd September 2022, https://groundviews.org/2022/02/09/the-tragic-lives-of-women-victims-of-the-pta/

කාන්තාව තව දුරටත් හුදෙකලා කෙරෙනු ලබයි. බුද්ධි අංශයේ නිලධාරීන්ගේ හා පොලිසියේ නිරන්තර පැමිණීම් නිසාද මෙම කාන්තාවන් මෙන්ම දරුවන් ද ස්වකීය ප්‍රජාව අතර ද හුදෙකලා භාවයට පත් කෙරෙයි. තරුණ කාන්තාවන් කිහිප දෙනෙකු පැමිණිලි කර සිටියේ තම සැමියාගේ නඩුව සම්බන්ධව කටයුතු කරන විමර්ශන නිලධාරියා හෝ ස්ථාන භාර නිලධාරියා විසින් දුරකථනය මගින් සිදු කරන ලිංගික හිංසනයන් පිළිබඳවය.

### 3) මධ්‍යම පළාතේ හසලක සිදු වූ මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය

2019 මැයි මස 17 වන දින හසලක ප්‍රදේශයේදී අබ්දුල් රහීම් මසාහිනා නම් 47 හැවිරිදි මුස්ලිම් කාන්තාව අත් අඩංගුවට ගනු ලැබුවේ ඇය නැවක රෝදයක් සහිත මෝස්තරයක් මුද්‍රණය කොට තිබූ දිගු ඇඳුමකින් සැරසී සිටි නිසාය. අත් අඩංගුවට ගත් නිළධාරීන් ඇයට චෝදනා කලේ ඇගේ වස්ත්‍රයේ මුද්‍රිත රෝදය බෞද්ධ ආගමික සංකේතයක් වන ධර්ම චක්‍රයට සමාන වන බවටයි. පොලීසිය ඇගේ නිවස වටලා ඇයට පැවසුවේ ඇගේ ඇඳුමේ මුද්‍රණයෙන් බුදු දහමට අපහාස වන බවට බෞද්ධ භික්ෂූන් වහන්සේලා පැමිණිලි කර ඇති බවත්, ඔවුන් ඇයගේ ඇඳුමේ ඡායාරූප, මාධ්‍ය ආයතන සමඟ බෙදා ගත් බවත්ය. පොලීසිය ඇය වට කර ගෙන ඇගේ ඇඳුම පරීක්ෂා කරමින් සිටින ඡායාරූපය සමාජ මාධ්‍ය වල ප්‍රචලිත විය.[9] මසාහිනාගේ සිද්ධිය, සිය වස්ත්‍රය පදනම් කොටගෙන පොලිස් පරීක්ෂාවට ලක් වූ බොහෝ මුස්ලිම් කාන්තාවන් අතරින් එක් අයෙකුගේ සිදුවීමක් පමණි. බොහෝ විට මෙම පුද්ගලයින් බොහෝ දුෂ්කරව ජීවිකාව ගැට ගසා ගන්නා අයවලුන් වන අතර, මසාහිනාගේ සිදුවීමේදී ඇය කළේ විවෘත වෙළඳපොළෙන් ඇයට දරා ගත හැකි මිලට ඇඳුමක් මිලට ගැනීමයි. වාර්ගික ප්‍රචණ්ඩත්වය ඇවිස්සීම සම්බන්ධයෙන් *ICCPR* පණතේ, 3 වැනි වගන්තිය යටතේ ඇයට චෝදනා එල්ල කොට අත්අඩංගුවට ගෙන ඇප නොමැතිව රඳවා තබා ගන්නා ලදී. මෙය පැහැදිලිවම ඇගේ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස හා ශාරීරික ගරුත්වය උල්ලංඝනය කිරීමකි. පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් පසු රට තුළ වැඩි වශයෙන් දක්නට ලැබුණු ඉස්ලාම් භීතිකාව (*Islamaphobia*) තුළ ඇය ඉලක්කයක් බවට පත් විය.

දින 17ක් සිර ගතව සිටි මසාහිනාව, පාස්කු බෝම්බ ප්‍රහාරයට ඇයගේ කිසිදු සම්බන්ධ කමක් නොතිබුණ ද ආරක්ෂක නිලධාරීන් විසින් නැවත නැවතත් ත්‍රස්තවාදියෙකු ලෙස හඳුන්වනු ලැබීය. මසාහිනා කෙරෙහි මෙම සිදුවීමේදී සැලකිලි දැක්වූ ආකාරය, ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන් මුහුණදෙන වෙනස් කොට සැලකීමේ ආකල්ප විදහා පෙන්වන අතර මෙමඟින් වෙනස් වූ ප්‍රජාවන් අතර අවබෝධය හා සහයෝගිතාවය ප්‍රවර්ධනය කිරීමේ දැඩි අවශ්‍යතාවය ඉස්මතු කොට දක්වයි.[10] ඇය එවැනි පහත් කොට සැලකීමකට ලක් වීම, අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය යටතේ මුස්ලිම් කාන්තාවන්ට මුහුණ දීමට සිදුව ඇති අවදානම කෙරෙහි ද අවධානය යොමු කරවයි.

පොලීසිය විසින් මසාහිනාට සැලකූ ආකාරය මෙන්ම රජයේ ප්‍රවෘත්ති ජාල වල ඡායාරූප පල කිරීම හා ඇප රහිතව රඳවා තබා ගැනීම වැනි කාරණා දෙස ස්ත්‍රී පුරුෂ සමාජ භාවීය කෝණයෙන් බැලූ කල බෙහෙවින්ම කණස්සල්ලට හේතු වේ. අනෙකුත් නිලධාරීන් ඇගේ ඡායාරූප ගන්නා අතරතුර ඇයට හිස ආවරණය ඉවත්කොට ඇඳුම ඇඳ ගන්නා ලෙස බල කිරීම තුලින්, ඇයගේ ශාරීරික ගරුත්වය, පෞද්ගලිකත්වය පැහැදිලිවම උල්ලංඝනය කිරීමක් වන අතර, ශ්‍රී ලංකාව තුල කාන්තාවන්ගේ හා ආගමික සුළුතරයන්ගේ අයිතිවාසිකම්

9 Twitter, Sri Lanka Tweet, 15th June 2019, https://twitter.com/SriLankaTweet/status/1139753968395886593

10 Aljazeera, 'Muslims 'targeted with arbitrary arrests' after Easter massacre', 16th June 2019, https://www.aljazeera.com/features/2019/6/16/muslims-targeted-with-arbitrary-arrests-after-easter-massacre

පිළිබඳව වැඩි අවධානයක් හා සංවේදිතාවයක් අවශ්‍ය බව ප්‍රත්‍යක්ෂ කරවයි.[11]

ශ්‍රී ලංකාව තුල ලිංගිකත්වය පදනම් කොට ගත් සම්මතයන් සහ අපේක්ෂාවන් ආගමික අනන්‍යතාවය සමග ව්‍යවච්ඡේදනය වන ආකාරය ද මසහිනාගේ සිදුවීමෙන් අවධාරණය කෙරේ. මුස්ලිම් සංස්කෘතිය තුල සම්ප්‍රදායික, විනීත ඇඳුමකින් සැරසී සිටි ඇය එම ඇඳුම නිසාම ඉලක්ක කොට ගැනීම බැහැර කළ නොහැකි කාරණයකි. රැඳවුම් භාරයේ සිටින කාලය තුලදී ඇය වාචික, ලිංගික අපයෝජනයන්ටද, කඳවුර තුලදී හා පොලිස් ස්ථානය තුලදී පිරිමි සිංහල නිලධාරින්ගේ  අවමන් කිරීම ඇතුළු ලිංගිකත්වය පදනම් කොට ගත් ප්‍රචණ්ඩත්වයටද ලක් විය. ඇගේ අත්දැකීමෙන් ප්‍රස්තුත කෙරෙනුයේ ආගම පදනම් කොටගත් වෙනස් කොට සැලකීමේ ලිංගිකත්වය හා බැදුනා වූ මානයන් තව දුරටත් අධ්‍යයනය කළ යුතු බවයි. එමෙන්ම ආගමික සුළුතරයන්ට අයත් කාන්තාවන් මුහුණ දෙන, විවිධාකාර ස්ථරයන්ට අයත් වෙනස් කොට සැලකීම් හඳුනා ගැනීම සඳහා අන්තර්චේදනීය ප්‍රවේශයන් ප්‍රවර්ධනය කළ යුතු බවයි.

### 4) ත්‍රිකුණාමලයේ මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය

2018 අප්‍රේල් මාසයේදී ත්‍රිකුණාමලයේ රජයේ පාසැලක් වන ශ්‍රී ෂන්මුග හින්දු කාන්තා විදුහලේ ඉගැන්වූ මුස්ලිම් ගුරුවරියන් 5 දෙනෙකුට, දැනට මුස්ලිම්වරුන් අඳින දිගු වස්ත්‍රයක් වන අබායා නම් ඇඳුම නිසා හිරිහැර වලට හා තර්ජන වලට මුහුණ පෑමට සිදු විය. ඔවුන් 2018 මැයි මාසයේදී ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාවට (*SLHRC*) පැමිණිලි කර ඇති අතර, විමර්ශන වලින් පසුව කොමිසම (*HRC/TCO*/27/18) තම රාජකාරිය කරන අතරතුර ගුරුවරුන්ට අබායා ඇඳීම වැළැක්වීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වගන්ති අංක 10, 12 (1), 12 (2), හා 14 (ඉ) යන ඒවා උල්ලංඝනය කිරීමක් බව තහවුරුකර එම නෛතික ප්‍රතිපාදන වලට අදාලව නිර්දේශ ඉදිරිපත් කරන ලදී.[12] මානව හිමිකම් කොමිසමේ තීන්දුව ධනාත්මක වුවද අබායා ඇඳීමට එරෙහිව ඇති වූ ප්‍රතිරෝධය දිගටම පැවතීම නිසා පීඩාවට පත් ගුරුවරියන් පස් දෙනාගෙන් හතර දෙනෙකුම අබායා ඇඳීමට ඉඩ නොදීම මත ස්ථාන මාරු වීම් ලබා ගෙන ෂන්මුග හින්දු කාන්තා විද්‍යාලයෙන් ඉවත් වූහ.

ස්ථාන මාරු නොලබා ඉතිරි වූ එකම ගුරුවරිය වන ෆාතිමා ෆහ්මිඩා රමීස් හට, ඇය අබායා ඇඳීම හේතුවෙන් පාසල තුල සේවය කිරීම සඳහා පැතූ අවසරය දිගින් දිගටම ප්‍රතික්ෂේප කරනු ලැබීය. ෆහ්මිඩා විසින් රිට් අයදුම් පතක් ගොනු කිරීම සහ, එම කාරණය අභියාචනාධිකරණයේ විභාග වීමේ ප්‍රතිඵලයක් ලෙස 2022 පෙබරවාරි 13 වන දින ඇයට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නැවත සේවයේ පිහිටුවීමේ ලිපියක් ලැබුණි. නැවත සේවයේ පිහිටුවීම සඳහා ලද ලිපියේ ශක්තියද සහිතව යලි සිය පාසල කරා සේවයට වාර්තා කිරීම සඳහා ඇය පැමිණි අවස්ථාවේ ඇයට එරෙහිව විරෝධතාවක් පවත්වන ලදී. විරෝධතා කරුවන් මෙහිදී කියා සිටියේ අබායා ඇඳීම නිසා හින්දු සංස්කෘතිය විනාශ වෙමින් පවතින බවයි. පාසලට පැමිණි ඇය සේවයට වාර්තා කිරීම සඳහා බලාසිටියදී විරෝධතාකරුවන්ගෙන් කණ්ඩායමක් පැමිණ, අබායා හැඳ ගෙන සේවයට වාර්තා කිරීම සඳහා විරෝධය පළ කරමින් ඇයට පහර දුන් බව වාර්තා විය. පසුව ඇති වූ ගුටි බැට හුවමාරුවේදී පාසලේ විදුහල්පතිවරියද තුවාල ලැබූ බවත්, ඉන් අනතුරුව ෆහ්මිඩා විසින් විදුහල්පතිවරියව තල්ලු කළ බවට පොලිස් නඩුවක් ද ගොනු කළ බවත්, මාධ්‍ය විසින් වාර්තා කරන ලදී. විදුහල්පතිවරිය විසින් තමාට

---

11 Aljazeera, 'Muslims 'targeted with arbitrary arrests' after Easter massacre', 16th June 2019, https://www.aljazeera.com/features/2019/6/16/muslims-targeted-with-arbitrary-arrests-after-easter-massacre

12 HRCSL, https://www.hrcsl.lk/wp-content/uploads/2021/06/4-HRC-TCO-27-18-HRCSL-REC-reg.pdf

පහර දුන් බවට ප්‍රති පැමිණිල්ලක් ෆහ්මිඩා විසින් ඉදිරිපත් කර තිබූ අතර, ඉන් අනතුරුව එකී විදුහල්පතිවරියට එරෙහිව ත්‍රිකුණාමලය මහේස්ත්‍රාත් අධිකරණයේ පෞද්ගලික පැමිණිල්ලක් ගොනු කරන ලදී. ප්‍රජාවන් අතර බෙදීමක් ඇති කිරීමේ හෝ ප්‍රකෝප කිරීමේ ආතතීන් සඳහා තුඩු දෙන මූලයන් මෙම සිදුවීම වටා ඇති බව ප්‍රකාශ කිරීම අමුතුවෙන් කිව යුතු නැති අතර, ෂන්මුග හින්දු කාන්තා විද්‍යාලය තුල මෙම ප්‍රජාවන් දෙක අතර ඇති වූ ආරාවුල හා ඉන් අනතුරුව ඇති වූ ප්‍රකෝපකාරී වටපිටාව වසර 4 ක (2018-2022) කාලයක් පුරාවට පැවතුණි.

බොහෝ ජාතිකවාදීන්ගේ හා ආගමික කතිකාවන්හි ස්ත්‍රීන්ගේ ඇඳුම පිළිබඳව වූ මෙම ප්‍රවණතාවය කේන්ද්‍රීය වී ඇති බව අපි දනිමු. ත්‍රිකුණාමලය සහ මඩකළපුව යන දිස්ත්‍රික්කවල හින්දු කාන්තාවන් සමග මෙම ඇඳුම පිලිබඳව වූ මතභේදය ගැන කල සංවාදයේ දී හින්දු ප්‍රජාව තුල මේ පිළිබඳව වෙනත් ආකාරයක අදහසක් පවතින බව පෙනී ගියේය. එය භක්තිය වැඩි දියුණු කිරීම හා හින්දු ආගමික, ලිංගිකත්වය පදනම් වූ චාරිත්‍ර පිළිබඳව නිරීක්ෂණය කළ හැක්කක් විය.

ෂන්මුග හින්දු විදුහලේ පැවති මුස්ලිම් ගුරුවරියන්ගේ අබායා ඇඳුම භාවිතයට එරෙහි වූ බොහෝ විරෝධතා සංවිධානය කරන ලද්දේ 'රාවණ සේනායි' නැමැති හින්දු ගැති කණ්ඩායමක් විසින් වන අතර, ඔවුන් චෝදනා කලේ මුස්ලිම් ගුරු මහත්මීන් අබායා ඇඳුම අඳිමින් හින්දු ශිෂ්‍යයින් ඉස්ලාම් ආගමට හරවා ගැනීමේ ප්‍රයත්නයක යෙදුණු බවටයි.[13] ෆාතිමා ෆහ්මිඩාට අබායා ඇඳීම තහනම් කර මුස්ලිම් ගුරුවරුන්ගේ ඇඳුම් පැළඳුම් සම්බන්ධයෙන් ගැටුමක් ඇති කරවමින් ඇයව ගුරු විවේකාගාරයට පිටමං කළ බවට මුල් කාලයේ දී විදුහල්පතිවරියට එරෙහිව චෝදනාවක්ද එල්ල විය. හා එනිසා අනිකුත් මුස්ලිම් ගුරුවරියන්ද ඇයට සහයෝගය පළ කිරීම සඳහා අබායා ඇඳීමට යොමු විය.

ඉහත සිදුවීම ලිංගික සමානාත්මතාවය හා, ආගමික හා ප්‍රකාශනයේ නිදහස යන අයිතීන් දෙකම උල්ලංඝනය කිරීමකි. මුස්ලිම් ගුරු මහත්මීන් ඔවුන්ගේ සංස්කෘතියට අනුගත වෙමින් ආගමානුකූලව ඔවුනට සුවිශේෂී වූ විශේෂයෙන්ම පසුගිය දශක දෙකක පමණ කාල සීමාව තුල මුස්ලිම් කාන්තාවන්ගේ වස්ත්‍ර රටාවේ සිදු වූ පරිවර්තනයන් ද සමග ඔවුන්ට ආවේණික වූ අබායා, බුර්කාව, මුහුණු වැස්ම යනාදී ඇඳුම් භාවිතයට හුරු විය. මන්ද යත් එනිසා ඔවුන් ප්‍රජාවේ ගෞරවය, භක්තියට පාත්‍ර වන අතර මෑතක සිට එය ප්‍රජාව මුහුණ දෙන මුස්ලිම් විරෝධී කටකථා වලට සහ ඉස්ලාම් භීතිකාවට එරෙහිව සටන් කිරීම සඳහා බොහෝ තරුණ මුස්ලිම් කාන්තාවන් විසින් යොදා ගනු ලබන අනන්‍යතා සංකේතයක් බවටද පත් වී ඇති බව පෙනේ.

හින්දු විරෝධතා කරුවන් මුස්ලිම් ගුරුවරුන්ට සාරියට අනුගත වන ලෙස බලපෑම් කිරීමට උත්සාහ කරමින් සිටියේ එය පාසැලේ කාන්තා ගුරුවරියන්ගේ ඇඳුම ලෙස සැළකෙන නිසාත්, එමෙන්ම එය හින්දු ආගමේ සහ දෙමළ සංස්කෘතියේ අංගයක් ලෙසද ගණන් ගැනෙන නිසාත් වූ අතර එමගින් මුස්ලිම් ගුරු මහත්මීන්ගේ ස්ව පුද්ගල තේරීමේ අයිතිය හා තමන්ව ප්‍රකාශ කිරීමට ඇති අයිතිය සීමා කෙරෙන ලදී. ඊට අමතරව සැබැවින්ම මෙම විරෝධතාවය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති මූලික මානව අයිතිවාසිකමක් වන ආගමික නිදහසට එල්ල වූ ප්‍රහාරයකි. ෂන්මුග පාසලේ ගැටුම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමේ වාර්ථාව (*HRC/TCO/27/18*) මගින්ද මෙය නැවත අවධාරණය කරන ලදී.

---

13 Aljazeera, 'Hindu group protests against Muslim teachers wearing abaya', 14th July 2018, https://www.aljazeera.com/features/2018/7/14/hindu-group-protests-against-muslim-teachers-wearing-abaya

නීතිඥයන් පවා තත්වය සමහන් කිරීමට උදව් නොකළ බව හැඟී ගියේ මුලදී දෙපාර්ශවයම තම සංක්ෂිප්තයෙන් ඔබ්බට ගොස් සමාදානය ගොඩනැගීමේ මාර්ග සහ විධි ගවේෂණය කිරීමට අකමැති වූ හෙයින් මෙන්ම පොදු මතය හා එක් වෙමින් කිසිවක්ම පරිත්‍යාග කිරීමට එකඟ නොවීමයි. කෙසේ වෙතත් ෂන්මුග විදුහලේ විදුහල්පතිවරිය වෙනුවෙන් පෙනී සිටි දක්ෂ, ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙකු මැදිහත් වී, ඔහු සිය ජනප්‍රියත්වය පරදුවට තබා තම සේවා දායකයාට දූරදර්ශීව, නිවැරදිව ක්‍රියාත්මක වීමට උපදෙස් ලබා දුන්නේය. බෙදීම් වැඩි දියුණු කෙරෙන මෙවන් පසුගාමී ජනතාවාදී ඉල්ලීම් බහුවිධ ප්‍රජාවන් විසින් ජය ගත යුතු බවත්, මෙම නඩුව විභාගයට ගත් විට සාමකාමී, තුලනාත්මක සම්මුතියක් සඳහා දිගින් දිගටම යෝජනා ගෙන ඒමෙන් සමස්ත යහපැවැත්ම, සාමය, සහජීවනය ඇති කළ හැකි බවත් ඔහු තම සේවා දායකයාට අවවාද දෙමින් වටහා දුන්නේය. මුලදී අකමැති වුවද, ෆහ්මිඩා වෙනුවෙන් පෙනී සිටි නීතිඥයනටද මෙම ප්‍රවේශය පසෙකට තල්ලු කිරීමට හෝ සාධාරණ ලෙස විරුද්ධ වීමට හෝ නොහැකි විය. මෙහිදී වෙනස් කොට සැළකීමේ තත්වය උග්‍ර කිරීම සඳහා මෙම ක්‍රියාදාමයන්වල මෙවලම් ලෙස යොදා ගත් කාන්තාවන් දෙදෙනාම, එනම් ෆහ්මිඩා සහ ෂන්මුග විදුහලේ විදුහල්පතිවරියද එකිනෙකාට ගරු කරමින් ආරාවුල එතෙකින් නිමාවට පත් කිරීමට එකඟ වූහ. මෙම පසුබිම තුල අවසානයේදී, තරඟකාරී පදනමක තිබූ මෙම නඩුව සුහදශීලී කොන්දේසි මත විසඳා ගැනීමට හැකි විය.

නමුත් මෙම විසඳුම, ද්‍රවිඩ හා මුස්ලිම් ප්‍රජාවන් අතර ද්වේශයේ ගින්න දිගින් දිගටම ඇවිලවීමටත්, භේද භින්න කරවීමටත් අවශ්‍ය වූ බලවේග වල ප්‍රසාදයට ලක් වූයේ නැත. ප්‍රජාවන් දෙකෙහිම මෙකී බලවේග දිගින් දිගටම දෙපාර්ශවයේම නීතිඥවරුන්ට චෝදනා කරමින් ඔවුන් තම ප්‍රජාවගේ අයිතිවාසිකම්, සම්මුතියකට යාමෙන් පාවා දීමක් කොට ඇති බවට චෝදනා කළේ පැහැදිලිවම  එකී අර්බුදය සාමයෙන් හා අභිමානයෙන් යුතුව, ප්‍රජාවන් දෙකෙහිම ජයග්‍රහණයක් ලෙස විසඳී ඇති බව පෙනෙන්නට තිබියදීත් ය. මෙම චිත්ත වේගීය ආරෝපිත තත්වයන් හැසිරවීමේදී උගත් මහේස්ත්‍රාත්වරයා ඔහුගේ බුද්ධිය ද යොදවමින් සමස්ත ක්‍රියා පටිපාටිය විස්තරාත්මකව සටහන් කර ගැනීමට ගත් තුලනාත්මක, සංවේදී සහ විචක්ෂණශීලී ප්‍රවේශය, තරඟකාරී බාහිර බලවේගයන් හි අවශ්‍යතා සමනය කිරීමට සහ සාවද්‍ය තොරතුරු වළක්වා ගනිමින් සුහදශීලී විසඳීමකට එළඹීමට බෙහෙවින් ඉවහල් වූ බව පිළි ගත යුතුය.

මෙම පාසලේ සිදුවීම ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ද්‍රවිඩ හා මුස්ලිම් ජනතාව අතර, විශේෂයෙන් පිරිමින් අතර, අසමගියට ද හේතු වූ අතර එය ආගමික ප්‍රචණ්ඩත්වයේ ලිංගිකත්ව ස්වරූපය පිළිබඳ අවබෝධයේ අවශ්‍යතාවය ගෙනහැර පායි. ලැජ්ජා සහගත ලෙස බොහෝ මුස්ලිම් පුරුෂයන් දෙමළ කාන්තාවන්ගේ ඇඳුම වූ සාරියට එරෙහිව සහ එම පාසලේ බොහෝ දෙමළ ගුරුවරුන්ට අපහාස කරමින් ඔවුන්ගේ ඇඳුම අසභ්‍ය ලෙස හා ඔවුන්ගේ ආගම අශීලාචාර ලෙස ලේබල් කරමින් සමාජ මාධ්‍ය යොදා ගනිමින් අවමන් කළහ. මෙකී ගැරහීම් ක්‍රියාවලිය තව දුරටත් ඉදිරියටම ගෙන යමින් මේ පුද්ගලයින් ද්‍රවිඩ ගුරුවරියන්ගේ සාරිය පටලවන සිරුර පහත් කොට සැළකිය යුතු ලෙසත්, අබායා අඳින මුස්ලිම් කාන්තාවන්ගේ සිරුරු වඩා ගෞරවාන්විත ලෙස සැළකිය යුතු බවත් ප්‍රචාරය කළහ. අබායා ඇඳීමට එරෙහිව හඬ නැගූ ගුරුවරියකගේ ලිංගික වෛෂයිකභාවය කෙතරම් කලබලකාරී මට්ටම් කරා ළඟා වූයේද යත්, මුස්ලිම් කාන්තාවන් සවිබල ගැන්වීමට උත්සාහ කරන ඇතැම් කාන්තා උපදේශන කණ්ඩායම්වලට, පිරිමින් විසින් උසිගන්වන ලද ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ආරවුල්වලට හසු නොවී සිටීම සඳහා තම ප්‍රවේශය නැවත සලකා බැලීමට සිදු විය. ඉහත කී, මුහුණුපොත තුල (*FB*) වින්දිත ගුරුවරිය එම පුද්ගලයින්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට ගත් උත්සාහය නිශ්ඵල වූයේ මෙකී ලිංගිකත්වය

පදනම් කොට ගත් පහර දීම් කෙරෙහි පොලිස් නිලධාරීන් තුල වූ අසංවේදීතාවය නිසාය. මෙම සිද්ධිය තවදුරටත් ප්‍රචණ්ඩත්වයට සහ සමාජ නොසන්සුන්තාවයට තුඩු දිය හැකි ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ජනවාර්ගික ආතතීන්ගේ ගැඹුර හෙළි කර පෙන්වයි.

මෙම ගැටළු නිසි ලෙස ආමන්ත්‍රණය කොට ඒවාට විසඳුම් සෙවීමට මෙන්ම විවිධ සංස්කෘතීන් හා ආගම් පිළිබඳව අවබෝධ කර ගනිමින් විවිධත්වයට ගරු කිරීම ප්‍රවර්ධනය කිරීමට වග බලා ගත යුතුය.

### 5) කුරුණෑගල මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය

2019 මැයි මස 25 වැනි දින පුවත්පත් හා වෙබ් අඩවි, කිසිදු සාක්ෂියක් ඉදිරිපත් නොකරම, සිංහල කාන්තාවන් වඳ භාවයට පත් කළ බවට මුස්ලිම් වෛද්‍යවරයෙකු වන ෂාෆි මහතාට චෝදනා කළේය.[14] පසුව පොලීසිය ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත යටතේ වෛද්‍ය ෂාෆිව අත්අඩංගුවට ගෙන රඳවා තැබූ අතර ජාතිකවාදී බෞද්ධ භික්ෂුවක් සහ දේශපාලකයන් ඔහුට එරෙහිව ත්‍රස්තවාදීන්ට සම්බන්ධ යැයි චෝදනා කරමින් මාධ්‍ය හරහා ප්‍රහාර ව්‍යාපාරයක් දියත් කළේය. ෂාෆි මහතාට එරෙහි චෝදනාවට තවදුරටත් වාසි දායක වන ලෙස එක්තරා අන්තවාදී භික්ෂුවක විසින් කාන්තාවන් 900කට අධික පිරිසක් සංවිධානය කරන ලදී.[15]

මුස්ලිම්වරුන් උපත් පාලන පෙති මිශ්‍ර ආහාර අලෙවි කරමින් සිංහල කාන්තාවන් වඳ භාවයට පත් කොට දරු උපත් පාලනය කරන්නට උත්සාහ දරන්නේ යැයි මුස්ලිම් ප්‍රජාවට එරෙහිව දිගින් දිගටම වෛරී ව්‍යාපාර දියත් කොට ඇත. මුස්ලිම් වෙළෙන්දන්, කාන්තාවන් වඳ භාවයට පත් කළ හැකි ඖෂධ වර්ග ඇඳුම් පැළඳුම් වලට ඇතුලත් කොට ඇතැයි චෝදනා කරමින් මුස්ලිම් වෙළෙන්දන්ගෙන් ඇඳුම් මිලදී ගැනීම වර්ජනය කරන ලෙස ඉල්ලා සිටිමින් උද්ඝෝෂණ ව්‍යාපාර සංවිධානය කළහ. වෛද්‍ය ෂාෆිගේ සිද්ධියේදී ඔහුගෙන් ප්‍රතිකාර ලබාගත් රෝගීන් මාධ්‍ය වෙත යොමු කරමින් එම චෝදනාව සනාථ කිරීමට උත්සාහ දැරීය. ඔහුට එරෙහි චෝදනා කිසිදු සාක්ෂියක් මත පදනම් නොවූ නමුත් බහුතර සිංහල ප්‍රජාවගේ ජනගහන මට්ටම අඩු කිරීමට මුස්ලිම්වරුන් කුමන්ත්‍රණය කරන බවට වූ විශ්වාසය මත මුල් බැසගත් ඒවා විය. නැවතත් පුළුල් ජාතික මට්ටමේ ඉස්ලාම් භීතිකාවේම කොටසක් ලෙස වෛද්‍යවරයෙකුට එරෙහිව අතිශයින්ම දේශපාලනීකරණය වූ මෙම වෘත්තීය කුමන්ත්‍රණයේ, කාන්තා සිරුරු සහ ඔවුන්ගේ ප්‍රජනන ක්‍රියාකාරිත්වය කේන්ද්‍රීය වී ඇති ආකාරය අපි දකිමු. 2013 සහ 2014 මුස්ලිම් විරෝධී ප්‍රහාර වල උච්චතම අවස්ථාව වන විට මුස්ලිම් කාන්තාවන්ගේ ප්‍රජනන ඉන්ද්‍රියයන් පාලනය කරන අතරම සිංහල කාන්තාවන්ට වැඩි වැඩියෙන් දරුවන් බිහි කරන ලෙස සිංහල ජාතිකවාදීන්, විශේෂයෙන් භික්ෂූන් වහන්සේලා හා මන්ත්‍රීවරයෙක්ද ඉල්ලා සිටි බවට ක්‍රියාකාරීන් විසින් උපුටා දක්වන ලද උදාහරණ තිබේ. නැගෙනහිර පළාතේ ක්‍රියාකාරීන් පෙන්වා දුන් පරිදි පශ්චාත් යුධ සන්දර්භය තුල මඩකළපුව ප්‍රදේශයේ ද්‍රවිඩ ජනයාට සාපේක්ෂව මුස්ලිම් ජනගහන ව්‍යාප්තිය සීමා කිරීම සඳහා දරුවන් 5 දෙනෙකුට වැඩි පවුල් සඳහා මුදල් දීමනා සහ සලාක හඳුන්වා දී ඇත. මෙම ක්‍රියාවන් සහ සංකල්ප මගින් කාන්තාවන්ගේ ප්‍රජනන ඉන්ද්‍රියයන් ප්‍රජාවකට එරෙහිව වෛරය ඇති කිරීමේ රණ බිම බවට පත් කරන ආකාරය මනාව පෙන්නුම් කරයි.

---

14 Adaderana, 'Complaints against Dr Shafi exceeds 1,000', 18th June 2019, https://www.adaderana.lk/news.php?nid=55820

15 https://www.thecitizen.in/index.php/en/NewsDetail/index/6/17253/Buddhist-Monks-Spearhead-Nationalist-Movement-in-Sri-Lanka-- (10th July 2019)

## 6) කරුවලගස්වැව, පුත්තලම මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය

ප්‍රදේශයේ ජනගහනයෙන් බහුතරයක් සිංහල ප්‍රජාව වන කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මුස්ලිම් කාන්තාවන් හට වෙනස්කම් වලට හා හිරිහැර වලට මුහුණ පෑමට සිදු වී ඇත. මෙහිදී 2019 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇඳුම් පැළඳුම් පිළිබඳ සංග්‍රහය[16] ඉතාමත් බැරෑරුම් ලෙස තකමින් එය ඔවුන්ගේ මුස්ලිම් කාර්යය මණ්ඩලයට බලහත්කාරයෙන් ක්‍රියාත්මක කොට ඇත.

එපමණක් නොව මුස්ලිම් නොවන කාර්යය මණ්ඩලය මුස්ලිම් කාන්තාවන් අබායා ඇඳීමට එරෙහිව විරෝධතා දැක් වූ අතර ඔවුන් අබායා ඇඳීම නවත්වන තුරු සාරිය ඇඳීම ප්‍රතික්ෂේප කිරීම නිසා මුස්ලිම් කාන්තාවන්ට එරෙහි හිංසනයන් තව දුරටත් බැරෑරුම් තත්වයට ඇද වැටුණි. මින් හුවා දැක්වෙනුයේ මුස්ලිම් නොවන සේවකයින් මුස්ලිම් කාන්තාවන්ගේ ආගමික නිදහස හා සංස්කෘතික අනන්‍යතාවයට ගරු කිරීමට සූදානම් නොවූ බවයි. ඊට අමතරව ඔවුන් වාර්ගිකත්වය හා ලිංගිකත්වය මත වෙනස් කොට සැළකීමේ බලවේගයේ කොටසක් බවට ද පත් විය.

මෙහිදී ගම්‍ය වන තවත් කාරණයක් නම් මුස්ලිම් නොවන පිරිස සිය කාර්යාලයීය මුස්ලිම් මිතුරියන්ගේ ආගමික නිදහසට හා සංස්කෘතික අනන්‍යතාවයට ගරු කිරීමට සූදානම් නොමැති බවයි.

මුස්ලිම් කාන්තාවන්ට කෙනෙහිලිකම් වලට මුහුණ දීමට සිදු වූවා සේම, ඔවුන් දිනපතා පරීක්ෂාවට ලක්කෙරුණු අතර ඔවුන්ගේ දිවා ආහාර භාජන ද පරීක්ෂා කළ නමුත් කාර්යාලයේ අනිකුත් සේවකයින්, විශේෂයෙන් මුස්ලිම් පිරිමි සේවකයින් පවා එසේ පරීක්ෂාවට ලක් වූයේ නැත. මුස්ලිම් කාන්තාවන්ට යාඥා කිරීම සඳහා කාමරයක් තබා ගැනීමට හෝ යාඥා කිරීමට ඉඩ නොදීම ඔවුන්ගේ ආගමික අයිතිවාසිකම් පැහැදිලිවම උල්ලංඝනය කිරීමකි. මේ තත්වය සැබවින්ම ලිංගිකත්වයට අනුව පහත් කොට සැලකීම පමණක්ම නොව වඩා අමානුෂීය කාරණාවක්ද වනුයේ එය ඔවුන්ගේ ආගම ඇදහීමේ අයිතිය සහ ස්වකීය පෞද්ගලිකත්වයට ගරුත්වය ලැබීමේ අයිතිය වැනි මූලික මානව අයිතිවාසිකම් පවා අහිමි කරවන ලද බැවිනි.

ඊට අමතරව, ශාමිලා (අන්වර්ථ නාමයකි) ඇයට සිදු වූ අසාධාරණය පිළිබඳව ප්‍රාදේශීය ලේකම් වරයාට පැමිණිලි කළ විට, ප්‍රශ්නය විසඳීමට පියවර ගැනීම වෙනුවට අදාල නිලධාරියා අබායා ඇඳීමේ අරමුණ ප්‍රශ්න කොට ඇති අතර, ඇය ඇඳුම් ඇඳීමට කම්මැලි තැනැත්තියක් ලෙස චෝදනා කරමින් ඇයට එරෙහි වෙනස් කොට සැලකීම තව දුරටත් තීව්‍ර කළේය.

කාර්යාලයේ සේවය කළ මුස්ලිම් පුරුෂයන්ද මෙම කාන්තාවන්ගේ ගැටළුවට විසඳුම් සෙවීමට සහය නොවෙමින් අනෙක් පාර්ශවයේ ඉල්ලීම් වලට අවනත වන ලෙස මුස්ලිම් කාන්තාවන්ගෙන් ඉල්ලා සිටීමෙන් ද පෙනී යනුයේ මෙම අර්බුදයේ පවතින ලිංගික සමාජභාවී ස්වරූපයයි. පිරිමින් බියගුළුව ස්වකීය ආගමික අනන්‍යතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා කාන්තාවන් යොදා ගන්නා අතර, තම ප්‍රතිරූපයට, ජීවනෝපායට හෝ වෘත්තීය දියුණුවට බාධාවක් වේයැයි හැඟෙන අවස්ථාවන්හි දී ඇය සටන අතහැර දමනු ලබයි. නමුත් කිසිදු තත්වයක් හමුවේ, අඩු තරමේ මෙම සිදුවීමේදී මුස්ලිම් කාන්තාවන් සිවු දෙනෙකුට රජයේ

16 Colombo Telegraph, 'Ministry Of Public Administration To Stop Female Public Servants Wearing Abaya?', 31st May 2019, https://www.colombotelegraph.com/index.php/ministry-of-public-administration-to-stop-female-public-servants-wearing-abaya/

රැකියා අහිමි වූ විටදී පවා, ඇය සිය සංස්කෘතික හෝ ආගමික චාරිත්‍ර අත් හරිනු ලබාවි යැයි ඔවුන් අපේක්ෂා නොකරයි. ඔවුන්ගේ ලිංගිකත්වය හෝ ආගම පිළිබඳ කාරණා නොතකමින් ස්වකීය සේවකයින් සඳහා ආරක්ෂිත හා සමාන පරිසරයක් සහතික කිරීම සේවා ස්ථානයේ වගකීම වුවද, මෙහිදී ද එම අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බව පෙනී යයි.

පවතින රාමුව තුළ විවිධ ආගමික හා සංස්කෘතික අනන්‍යතාවයන් නොඉවසන බවට කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිදුවීම පැහැදිලි උදාහරණයක් ද වේ. මුස්ලිම් නොවන සේවකයින් සිය මුස්ලිම් කාන්තා සගයින් මත ඔවුන්ගේම සංස්කෘතික විශ්වාසයන් පටවමින් සිටි අතර, මුස්ලිම් කාන්තාවන්ගේ විශ්වාසයන් හා පිලිවෙත් වලට කිසිදු ගෞරවයක් දැක්වීම සඳහා සම්මුතියක් ඇති කර ගැනීමට කැමැත්තක් දැක්වූයේ ද නැත. මුස්ලිම් පුරුෂයින්ගේ සහයෝගය නොමැතිකමින් පවා ඉස්මතු කෙරෙනුයේ වෙනස් කොට සැලකීමට හා අගතියට එරෙහිව සටන් කිරීමේදී ආන්තික ප්‍රජාවන් තුල සහයෝගිතාවය හා එකමුතු කම අවශ්‍ය බවයි. ප්‍රාදේශීය ලේකම්වරයා කටයුතු කළ ආකාරය ද මෙහිදී සැලකිල්ලට ගත යුතු වන්නේ ඔහු ද සැබෑ ගැටළුව ආමන්ත්‍රණය කිරීම පසෙක තබා, දේශනා දෙමින් මුස්ලිම් කාන්තාවන්ගේ මතය වෙනස් කරන්නට උත්සාහ කිරීම හේතුවෙනි.

තව දුරටත් විස්තර කරමින් ශාමිලා ප්‍රකාශ කළේ තම සේවා ස්ථානයට එනම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යාම සඳහා තමන් හට මුර පොලවල් 3ක් පසු කිරීමට සිදු වූ බව හා ඒ සෑම ස්ථානයකදීම තම හැඳුනුම්පත පෙන්වා ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතු වූ බවත්ය. මේ තත්වය එවැනි වෙනත් අවස්ථාවකදී ඇති වන අවශ්‍යතාවයට වඩා සුවිශේෂී වූ බව ඇය ප්‍රකාශ කළාය. ශාමිලා මේ පියවරයන් ගැන ඇගේ වන කලකිරීම ප්‍රකාශ කරමින් පැවසූයේ සමහර අවස්ථා වලදී එම ම්ලේච්ඡ ක්‍රියා තමන්ට එපා වූ බවත් එය තව දුරටත් දරා ගත නොහැකි වූ බවත්ය.

සිංහල බහුතරයක් ජීවත් වන ප්‍රදේශ වල මුස්ලිම් කාන්තාවකට රජයේ රැකියාවක් ලැබෙනුයේ කලාතුරකින් වන අතර මෙහිදී ආන්තික ප්‍රජාවන් මත පැටවෙන අමතර පීඩනය පැහැදිලි වෙයි. මෙම රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය හේතුවෙන් සිංහල ප්‍රදේශ වල සේවය කරන මුස්ලිම් කාන්තාවන්ට තම සේවය අත හැර යන ලෙසට බල කිරීම හෝ මුස්ලිම් ප්‍රදේශ වලට මාරු වී යාමට හෝ වෙනත් පෞද්ගලික අංශයේ රැකියා සඳහා යාමට සිදු විය. ජාතික ආරක්ෂාවේ නාමයෙන් හඳුන්වා දී ඇති මෙම අතිරේක ආරක්ෂක පියවර නිසා ජාතීන් අඛණ්ඩව වෙන් කොට ඉවත් කර තැබිය හැකි අතර, දැනටමත් ඔවුන්ගේ ප්‍රජාව තුල ජාතිකවාදීන්ගේ හා අන්තවාදීන්ගේ වෙනස්කම් වලට හා අගතීන්ට මුහුණ දෙන මුස්ලිම් කාන්තාවන් මෙම තත්වය නිසා තව දුරටත් හුදෙකලා කෙරෙනු ඇත. ශාමිලාට සිය රැකියාව මාරු කිරීමටත්, සේවා ස්ථානයෙන් ඉවත් වීමටත් සිදු වීමෙන් පෙනී යනුයේ මෙම ක්‍රියා මාර්ග හරහා ඇය මත පටවා ඇති කෲරත්වය හා එවැනි වෙනස් කොට සැලකීමේ ක්‍රියාවන් නිසා එවැනි පුද්ගලයින්ට ඇති කළ හැකි වෙහෙස හා පීඩාව පිළිබඳව ඇඟවීමකි. එමෙන්ම එය විවිධත්වය පිලිගැනීම පිළිබඳ මනා අවබෝධයකින් යුතු වීමේ හා සෑම කෙනෙකුටම ඇගයීමක් හා ගෞරවයක් සහිතව ඇතුලත් විය හැකි පිලිගැනීමක් සහිත පරිසරයක් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවයද මතු කර පෙන්වයි.

### 7) පුත්තලම නගරයේ මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය

ඇඳුම් පැළඳුම් සංග්‍රහය පිළිබඳ 2019 රජයේ චක්‍රලේඛයට අනුව, 2019 ජූනි 19 වැනි දින, 16 හැවිරිදි ගැබිණි කාන්තාවක් වූ ෆයාසා (අන්වර්ථ නාමයකි) නමැත්තිය, සිය මුහුණ ආවරණය

කර ගෙන හිඳීම සම්බන්ධයෙන් අත් අඩංගුවට ගෙන, පසුව ඇප රහිතව දින 24ක් මීගමුවේ සිර ගත කර තබන ලදී.

නියමිත සායනයට පැමිණීමට පෙර දින, මුස්ලිම් කාන්තාවන් ඔවුන්ගේ මුහුණ ආවරණය කර ගෙන හිඳීම සම්බන්ධයෙන් අත් අඩංගුවට ගන්නා ආකාරය ගැන මිනිසුන් සාකච්ඡා කරන අයුරු ෆයාසාට අසන්නට ලැබුණි, පසු දින යුවළ සායනයට යාමට සූදානම් වන අවස්ථාවේදී ඇය තමන්ට අසන්නට ලැබුණු පුවත ගැන සැමියා දැනුවත් කොට, මුහුණ ආවරණය කිරීමට තමාගේ අකමැත්ත පළ කළාය. කෙසේ වෙතත් සැමියා විසින් ඇය මුහුණ ආවරණය කර ගත යුතු බව තරයේ කියා සිටීම නිසා ස්වකීය නොකැමැත්ත පසෙක තබා ඇය ඔහුගේ ඉල්ලීම ඉටු කළාය.

සිද්ධිය සිහිපත් කරමින් ෆයාසා කියා සිටියේ සායනය සඳහා ඔවුන් පැමිණි විට හමුදා නිලධාරීන් ඇයව මුණ ගැසී මුහුණු ආවරණය ඉවත් කරන ලෙස ඉල්ලා සිටි බවයි. ඊට වහා අවනත වූ ෆයාසා හැකි ඉක්මනින් එය ඇගේ අත් බෑගයේ රුවා ගත් අතර පුදුමයකට මෙන් ඇගේ සැමියා මෙහිදී ඇයට විරුද්ධ වූයේ නැත.

සායනයෙන් පිට වී ගිය පසු ඇය සහ ඇගේ සැමියා ජාතික හැඳුනුම්පත ලබා ගැනීම සඳහා ඡායාරූපයක් ගැනීමට ඡායාරූප මැදිරියකට ගියහ. අවාසනාවකට මෙන් ඡායාරූපාගාරය දුමෙන් පිරී තිබුණු අතර, හුස්ම ගැනීමේ අපහසු තාවයට පත් වූ ඇයට ඔක්කාරය දැනෙන්නට විය. සිය අපහසුව යටපත් කර ගැනීම සඳහා උත්සාහයක් ලෙස ඇය තම නාසය වසා ගැනීමට අත් ලේන්සුව භාවිතා කළාය. කෙසේ හෝ, ඒ අවස්ථාවේ ඡායාරූපාගාරයේ හුන් අයෙක් මේ සිදුවීම පොලිස් ස්ථානයට දන්වා ඇති අතර, ඡායාරූප ගැනීමේ කාර්යය අවසන් කිරීමටත් පෙර පොලිස් නිලධාරීහු පැමිණ ඇයව අත් අඩංගුවට ගෙන රැඳවුම් භාරයට පත් කලහ.

ඇයගේ පැකිළීම නොතකා ඇගේ සැමියා විසින් මුහුණු ආවරණය පළඳින ලෙස බල කර සිටීම බොහෝ ප්‍රජාවන් තුල ලිංගිකත්ව සමාජභාවයේ අසමානතාවය සහ කාන්තාවන්ගේ නියෝජිතායතනයක ඌනතාවය යන කාරණා මොනොවට පැහැදිලි කරවයි. වයස අවුරුදු 16 ක් වූ ඇය ගැබිණියක වූ අතර ඇගේ ශරීරය හෝ ඇඳුම පිළිබඳව ඇයට ස්වාධීනත්වයක් නොතිබිණි. තම විශ්වාසයන්ට, කැමැත්තට හෝ ආරක්ෂාවට අනුකූල නොවූව ද බොහෝ විට කාන්තාවන්ට සිය පිරිමි සහකරුවාගේ අභිමතයට එකඟ වීම සඳහා බල කෙරෙනු ලැබේ. මෙම සිදුවීමේදී ෆයාසාට තම ස්වාමි පුරුෂයාගේ අභිප්‍රාය ඉටු කිරීම සඳහා අත්‍යවශ්‍යයෙන්ම ඇයගේ මනාපය කැප කිරීමට බල කෙරුණු අතර එහි ප්‍රතිපලයක් ලෙස ඇයට අත් අඩංගුවට පත් වී දින 24ක් සිර ගත වී හිඳීමට ද සිදු විය.

පූර්ණ ගැබිණියක්ව සිටියදී පවා ඇයව ඇප රහිතව දීර්ඝ කාලයක් සිර ගත කොට තැබීම, මෙරට සුළු ජාතීන්ට එරෙහිව කාලාන්තරයක් තිස්සේ නීතිය අවභාවිතා කරන ආකාරය පිළිබඳ පැහැදිලි නිදසුනක් සපයනවා සේම නිසි ක්‍රියාවලියකට අනුව සාධාරණ නඩු තීන්දුවක් ලබා ගැනීම සඳහා ද, කාන්තා අයිතීන් සුරක්ෂාව සඳහා ද ඍණාත්මකව බලපෑම් කෙරෙන ආකාරය විදහා පෙන්වයි. ඇයගෙන් කවර අන්දමේ හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වූ බවට කිසිදු චෝදනාවක් නොමැතිව සිටියදී පවා මෙතරම් දිගු කාලයක් රඳවා තබා ගෙන හිඳීමෙන් පෙනී යනුයේ ඇයව අසාධාරණ ලෙස ඉලක්ක කොට ගෙන ඇති බවයි. පූර්ණ ගැබිණියක් වූ බාල වයස්කාර දරුවෙකු, ලේන්සුවකින් මුහුණ වසා ගැනීම පාදක කොට ගෙන, කිසිදු වලංගු චෝදනාවකින් තොරව, රඳවා තබා ගැනීමට ඉඩකඩ සලසන මේ ක්‍රමය කෙතරම් අගතිගාමී හා අනුකම්පා විරහිතද යන්න මෙහිදී සැළකිල්ලට

ගත යුතු තවත් කාරණයකි. ඇයගේ නිවසේදී අප ඇයව මුණ ගැසෙන විට, ඇය තම පුතාව අප හට පෙන්වමින් ප්‍රකාශ කළේ තමන් සිර භාරයෙන් නිදහස ලබා දින කිහිපයකට පසුව ඔහු උපත ලද බවත් රැඳවියකුව සිටියදී තමනුත් දරුවාත් විඳි මානසික කම්පනය අද ඔහුගේ හැසිරීම් රටාවෙන් පෙන්නුම් කෙරෙන බවත්ය. ඇය මුස්ලිම් කාන්තා සංවර්ධන භාරයට මෙන්ම නීතිඥවරියන්ට ද දිගින් දිගටම ඇය වෙනුවෙන් කටයුතු කරමින් නඩුව නිෂ්ප්‍රභා කර ගැනීමට කැපවීම පිළිබඳව ස්තුතිය පුද කළාය. තව දුරටත් කරුණු එළිදරව් කළ ඇය, තම පුතුගේ උපතින් පසුව, සිය සැමියා වෙනත් විවාහයක් කර ගත් බවත් ඇය දැන් එකම නිවසේ ඒ කාන්තාවද සමග වාසය කරන බවත් අප හට පැවසුවාය.

මෙම සිදුවීම තුලින් අවධාරණය කෙරෙන කාරණය නම් ශ්‍රී ලංකාව තුල ආගමික නිදහස හා ලිංගික සමානත්මතාවය කෙරෙහි ගෞරවනීය ප්‍රවේශ අවශ්‍ය බව හා රජය මගින් මුස්ලිම් කාන්තාවන් හා දරුවන් සුවිශේෂීව මුහුණ දෙන පද්ධතිගත වූ වෙනස් කොට සැලකීම් කෙරෙහි අවධානය යොමු කළ යුතු බවත්ය.

### 8) පුත්තලම රෝහල් තුල මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය

මුස්ලිම් කාන්තා රෝගීන් හට කටුක අන්දමින් සළකනු ලබන බවට ප්‍රාදේශීය කාන්තා සංවිධාන කරා විශ්වාස කටයුතු පැමිණිලි ලැබී තිබෙන අතර ඔවුන් බොහෝ දෙනෙකුගේ ආගමානුකූල අයිතියක් වන හිස ආවරණය කර ගැනීමේ අයිතිය ප්‍රතික්ෂේප කෙරෙන බව ද දැනගන්නට ඇත. තවද හිජාබයක් හෝ හිස් ආවරණයක් පැළඳීම සම්බන්ධයෙන් මුස්ලිම් කාන්තාවන්ට රෝහල් කාර්යය මණ්ඩලය විසින් බැණ වැදී ඇති අතර, එය ඔවුන්ට කෙරෙන අගෞරවයක් පමණක් නොව ඔවුන්ගේ මානව හිමිකම්ද උල්ලංඝනය කිරීමකි. පාස්කු ප්‍රහාරයත් සමගම බොහෝ හිජාබ් සහ අබායා හැඳ සිටි කාන්තාවන්ගේ හිස් ආවරණ ගලවා දමනු ලැබුවේ ආරක්ෂක හේතූන් මතය. කාන්තාවන් පැමිණිලි කළේ තමන් රෝහල් වලට යාමෙන් වැළකී පෞද්ගලික වෛද්‍යවරුන්ගෙන් ඖෂධ ලබා ගැනීම හෝ ඖෂධ මිලට ගැනීම සඳහා පැරණි බෙහෙත් වට්ටෝරු භාවිතා කිරීම සිදු කරන බවය. ගැබිණි කාන්තාවන් මැසිවිලි නැගුවේ තමන්ට පපුව ආවරණය වන සේ සේලය පැළඳීමට ඉඩ නොදෙන බවත් සමහර විට වෛද්‍යවරයා ඔවුන් පරීක්ෂා කිරීම සඳහා ඇඳ කරා ඒමට පෙර හෙදියන් එය බලහත්කාරයෙන් ඉවත් කරන බවත්ය. එක් තරුණ මවක් දරු ප්‍රසූතිකාගාරයේදී තම දෙපා වැරෙන් අල්ලා ගෙන සිටි හෙදියව තල්ලු කළ විට ඇය තමන්ට ප්‍රතිචාර දැක්වූ කුරිරු ආකාරය ගැන කතාවක් පැවසුවාය. හෙදිය ඇයගේ කලවා මිරිකා ඇයගෙන් විමසා ඇත්තේ වේදනාව දරා ගත නොහැකි නම් මුස්ලිම් කාන්තාවන් එකෙකුට පසුව තවෙකකු සේ දරුවන් හදනුයේ මන්ද කියාය. වින්නඹු මාතාවන් හමු වීමට මාසික සායන වලට පැමිණෙන නව මව්වරුන්ට තමන්ට වඩාත් පහසු යැයි හැඟෙන ඇඳුම් ඇඳීමට අවසර නැත. ඔවුන් අබාය ඇඳීමට තීරණය කළහොත් ඔවුන්ට බැණ වදිනු ලබන අතර ඒවා ඉවත් කිරීමට පවසනු ලැබේ. වින්නඹු මාතාවන් මෙය සාධාරණීකරණය කරනුයේ තමන්ට නිසි පරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා පහසු ප්‍රවේශයන් අවශ්‍ය බවටයි. නමුත් මෙම අවශ්‍යතාවය පාස්කු ප්‍රහාරයට පෙර ඇති වූයේ නැත.

සමහර රෝහල් වල ප්‍රතිපත්තිමය වශයෙන්, සනීපාරක්ෂක හේතූන් මත හිස ආවරණය ද ඇතුළුව රෝගීන්ගේ ඇඳුම් සඳහා තහංචි පනවා ඇති බව මතක තබා ගැනීම වැදගත් වේ. රෝහල් වල සනීපාරක්ෂාව පිළිබඳව ඉහළ ප්‍රමිතීන් පවත්වා ගැනීම අපට ද ඉතා වැදගත් වන නමුදු මෙම ප්‍රතිපත්ති කිසියම් ආගමික හෝ සංස්කෘතික කණ්ඩායමකට වෙනස් කොට සැළකීමක් නොවිය යුතුය. මෙමගින් රාජ්‍ය ව්‍යුහයන් තුල මුල් බැස ඇති ජාතිවාදයේ

ස්වරූපය හා සෞඛ්‍ය පද්ධතිය හරහා පවා පුද්ගල ආගමික විශ්වාසයන් පාදක කොටගෙන පීඩාවට පත් කෙරෙන ආකාරය ගෙන හැර පායි.

### 9) පුත්තලමේ පාසල් තුල මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය

පුත්තලම දිස්ත්‍රිකයේ ඇතැම් පාසැල් දරුවනගේ දෙමාපියන් අප සමග බෙදාගත් ශෝචනීය අත්දැකීම වූයේ හිජාබය හෝ ඔවුන් අඳින දිගු කලිසම හැඳ ගෙන සිංහල හෝ ද්‍රවිඩ පාසැල් වලට යාමේදී දැඩි මානසික පීඩාවනට මුහුණ දීමට සිදු වන බවත්, උසස් පෙළ විභාගය සඳහා හෝ සිංහල, දෙමළ ප්‍රදේශ වල පාසැල් වලට ඇතුලත් වීමට හෝ ඔවුන්ගේ දරුවන්ට අවසර ලබා නොදෙන බවත්ය. මේ කාරණය සම්බන්ධයෙන් පාසැල් මගින් අනුගමනය කරන ප්‍රතිපත්ති එකිනෙකට වෙනස් වෙන බවත් සමහර බලධරයින් දෙකන් විවෘතව තබා ගැනීමේ එකඟතාවය මත හිජාබය පැළඳීමට අවසර දෙන බවත් දැන ගන්නට ලැබුණි.

සිසුන්ගේ අනාගතයට සහ ඔවුන්ගේ රැකියා වලට සැළකිය යුතු බලපෑමක් ඇති කරන උසස් පෙළ විභාගය පිළිබඳව සැලකිල්ලට ගෙන විභාග ශාලාව තුල මොනයම් අයුරක හෝ බාධාවක් සිදුවීම වැළැක්වීම සඳහා කිසිදු ආකාරයක ආවරණයක් තබා ගැනීමට ඉඩ නොදෙන බව කියනු ලැබේ. පාස්කු ප්‍රහාරයට පෙර සාමාන්‍යයෙන් හිස සහ පාද ආවරණ පිලි ගැනුණ නමුදු ප්‍රහාරයට පසුව ඒවා හෙළා දකිමින් දරුවන් නිරන්තරයෙන් පරීක්ෂාවට ලක් කරනු ලැබේ. ආගමික ඇඳුම මත පදනම් වූ මෙම වෙනස්කම් කිරීම පිළිගත නොහැකි වනවා මෙන්ම, සියලුම සිසුන්ට සමාන අවස්ථා සහතික කිරීම සඳහා අවධානය යොමු කළ යුතු වේ. රිෂ්නා අප සමග පැවසුවේ උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටි පළමු දිනයේම තමන්ගෙන් හිජාබය ඉවත් කරන ලෙස ඉල්ලා සිටි බවත් විභාග ශාලාවේ කාර්යමණ්ඩලය විසින් ප්‍රසිද්ධියේ තමන් අවමානයට ලක් කළ ආකාරය ගැන මහත් අපහසුතාවයට පත් වූ බවත්ය. එමෙන්ම ඉන්පසු ඇය ඉතිරි විෂයයන් සඳහා පෙනී සිටියේද නැත.

### 10) පුත්තලමේ මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය - මුරපොලවලදී

පුත්තලම ප්‍රදේශයේ රැකියා කරන මුස්ලිම් කාන්තාවන් පොදු ප්‍රවාහන සේවා භාවිත කිරීමේදී මුරපොලවල් වලදී මුහුණ දෙන වෙනස් කොට සැලකීම් පිළිබඳව අසන්නට ලැබීම මහත් කණස්සල්ලට කරුණකි. යුද හමුදා නිලධාරීන්, විශේෂයෙන් මුස්ලිම් කාන්තාවන් ඉලක්ක කරගනිමින්, ඔවුන්ට අවමන් සහගත ලෙස සැළකීම පිළිගත නොහැකි අතර එය ඔවුන්ගේ මූලික මානව හිමිකම් උල්ලංඝනය කිරීමකි.

එවැනි ක්‍රියා මගින් මෙම කාන්තාවන්ට ඇතිවන මානසික බලපෑම කියා නිම කළ නොහැක. ඔවුන්ගේ ආගම මත පදනම්ව අන් අය ඉදිරියේ වෙන් කොට අවමානයට ලක් කිරීම සැලකිය යුතු මානසික පීඩාවක් සහ කම්පනයක් ඇති කළ හැකි අතර, එය ඔවුන්ගේ මානසික සෞඛ්‍යයට සහ යහපැවැත්මට දිගුකාලීන අහිතකර බලපෑම් ඇති කර හැකිය. 2019 ජූනි මස කොළඹ සිට මන්නාරම බලා ගමන් කරමින් සිටි තරුණ නීතීඥවරියක් චෙට්ටිකුලම් හමුදා මූලස්ථාන මුරපොලේදී නවතා ඇති අතර එම කාන්තාවට ඇයගේ හිස් ආවරණ ගලවා ගැනීමට මද වේලාවක් ගත වූ හේතුවෙන් හමුදා කාන්තාවක් ඇගේ හිජාබය කපා දැමීමට කතුරක් ගෙන ඇත. ඇය සිතන පරිදි මෙම හමුදා මුරපොළවල් වලදී වෙනත් කාන්තාවන්ගේ හිජාබයන් කපා ඉවත් කර ඇති නමුත් ඇයගේ නීතිඥ සංගමයේ කාඩ් පත තිබූ නිසාම පමණක් ඇයට එයින් ගැලවීමට හැකි වූ බවයි.

මුස්ලිම් කාන්තාවන් මුස්ලිම් නොවන අය ඉදිරියේ විශේෂයෙන් ඉලක්ක කර අවමානයට ලක් කිරීම තැති ගන්වන සුළු වන අතර එම ක්‍රියාවන් මුස්ලිම් කාන්තාවන්ගේ ගෞරවයට ද හානි කරයි. හමුදා නිලධාරීන් විසින් ආරක්ෂාවේ නාමයෙන් මුස්ලිම් කාන්තවන්ගේ රෙදි/ හිජාබයන් ඉරා දැමීම ඔවුන්ගේ මූලික මානව හිමිකම් උල්ලංඝනය කිරීමකි. කෙසේ වෙතත්, උතුරේ හමුදා මුරපොළ වල කාන්තාවන්ගේ ශාරීරික ස්වාධීනත්වය හා ස්වයං නිර්ණය උල්ලංඝනය කිරීම සාමාන්‍ය දෙයක් වන අතර බන්ධනාගාරවලදී සහ රැඳවුම් කඳවුරුවලදී ද කාන්තාවන් තම කිට්ටු ඥාතීන් බැලීමට යන විට, ඔවුන්ව මේ හා සමානව පහත් සැළකීම් වලට ලක් වේ. මෙම හැසිරීම සුළුතර ආගම් සහ ජන වර්ග වල කාන්තාවන්ගේ මූලික මානව හිමිකම් උල්ලංඝනය කරනවා පමණක් නොව, සමාජය තුළ නොඉවසීම සහ බෙදීම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කෙරෙන බවද පිලි ගත යුතු කරුණක් වේ.

### 11) පුත්තලමේ මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය - බැංකු තුලදී

2019 පාස්කු ප්‍රහාරයෙන් වසර හතරකට පසුවත් පුත්තලමේ බැංකු තුල මුස්ලිම් කාන්තාවන් අබායා ඇඳීමට එරෙහිව දිගින් දිගටම වෙනස්කොට සැළකීම සිදු කරනු ලබයි. අවාසනාවකට, සමාජයේ බොහෝ මුස්ලිම් කාන්තාවන්ට, සමාජ හා සංස්කෘතික බාධක හේතුවෙන් අධ්‍යාපනය ලැබීම සඳහා හෝ වෙනත් වෘත්තීය අවස්ථා සඳහා ප්‍රවේශයක් නොමැත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඔවුන් බොහෝ විට ඔවුන්ගේ පිරිමි සගයන් තරම් සාක්ෂරතා ප්‍රවීණතාවයෙන් තොර වන අතර, එය තවදුරටත් බැංකු කටයුතු වලට ප්‍රවේශ වීමේදී ඇති වන ප්‍රශ්න උග්‍ර කරයි. එමෙන්ම අවශ්‍ය දැනුම සපුරා ඇති නමුත් ඇඳුම් පැළඳුම් නිසා බැංකුවලට යාමට ප්‍රවේශය අහිමි වන මුස්ලිම් කාන්තාවන්ට මෙම තත්ත්වය වඩාත් දරුණු වේ.

මෙම ආකාරයේ මුස්ලිම් කාන්තාවන් සඳහා සුවිශේෂී වන වෙනස් කොට සැළකීම පිළිගත නොහැකි අතර එය පුරුෂාධිපත්‍යය ශක්තිමත් කරමින් පිරිමින් මත ඔවුන්ගේ යැපීම තවදුරටත් ශක්තිමත් කරයි. ඔවුන්ගේ ලිංගිකත්ව සමාජභාවය සහ ආගමික විශ්වාසයන් නිසා ඔවුන් ඔවුන්ගේම පවුල තුලදී මෙන්ම, රජය විසින් ද කොන් කිරීමට ලක් වනු ලැබේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජාතිය සහ ජනවාර්ගිකත්වය මත පදනම් වූ මෙම වෙනස් කොට සැළකීම් දැඩි අපරාධ ලෙස නම් කළ යුතු අතර, සියළු පුද්ගලයන්ට සමානව හා ගෞරවයෙන් සළකන බව සහතික කිරීම සඳහා වහාම මේවාට පිළියම් යෙදිය යුතුය.

### 12) අකුරණ, මහනුවර - මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය

2023 අප්‍රේල් 21 හෝ 22 යන එක් දිනයකදී පැවැත්වීමට නියමිතව තිබූ ඊද් උත්සවයේදී ඇතිවිය හැකි තර්ජනයක් පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීමට, අකුරණ පොලිසියේ ස්ථානාධිපතිවරයා සහ මහනුවර සහකාර පොලිස් අධිකාරීවරයා පසුගියදා අකුරණ මුස්ලිම් පල්ලියට ගියේය. මේ හේතුවෙන් මුස්ලිම් පල්ලියට නිසි ආරක්ෂක පියවර ගන්නා ලෙස පොලිසිය විසින් ඉල්ලා සිටි අතර, අවශ්‍ය ආරක්ෂක සහාය ලබා දීමට ද පොරොන්දු විය.

මෙම තොරතුරු ලැබීමෙන් පසු, පල්ලියේ නිලධාරීන් එය මුස්ලිම් ප්‍රජාව සමඟ බෙදා ගත් අතර, එම පණිවිඩය ඔවුන්ගේ වට්ස්ඇප් (*WhatsApp*) සමූහ සහ මුස්ලිම් කාන්තාවන් සිටින වෙනත් රැස්වීම් හරහා ප්‍රජාවට ලබා දෙන ලෙස ඉල්ලා සිටියේය. මුස්ලිම් කාන්තාවන්, ආගමික නායකයින් සහ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් යන දෙපාර්ශවයේම වැඩි අවධානයට ලක්විය හැකි බැවින් මෙම කාලය තුළ ඔවුන් වැඩි වශයෙන් ප්‍රවේශම් විය යුතු බව ඔවුහු

විශේෂයෙන් අවධාරණය කළහ.

ආරක්ෂක පියවරක් ලෙස, ප්‍රහාරකයින්ට අබායා වැනි ඇඳුම් ඇඳ වෙස්වළා ගත හැකි බැවින්, මුස්ලිම් කාන්තාවන්ට සම්පූර්ණ අබායා/ මුහුණු ආවරණ පැළඳීමෙන් හෝ රාමසාන් හෝ ඊද් සමයේදී මුස්ලිම් පල්ලියට පැමිණීමෙන් වළකින ලෙස මුස්ලිම් පල්ලියේ නිලධාරීන් උපදෙස් දුන්නේය. මෙම ප්‍රහාරයන් කවුරුන් හෝ විසින් සිදු කල හැකි බැවින් ඔවුන් හඳුනාගැනීම ඉතා අපහසු වන බවට පොලිසිය වැඩිදුරටත් අනතුරු අඟවා ඇත.

එළඹෙන ඊද් උත්සවයේදී ප්‍රජාවගේ ආරක්ෂාව තහවුරු කිරීමට පොලිසිය සහ මුස්ලිම් පල්ලියේ නිලධාරීන් එක්ව කටයුතු කරනු ඇති අතර සුපරීක්ෂාකාරීව සිටීමට සහ සිදුවිය හැකි හානිය වළක්වා ගැනීමට අවශ්‍ය පූර්වාරක්ෂාවන් ගැනීමට ඔවුන් සියලු දෙනාගේ මෙන්ම, විශේෂයෙන් මුස්ලිම් කාන්තාවන්ගේ ද සහයෝගය ඉල්ලා ඇත.

රාමසාන් හෝ ඊද් සමයේදී සම්පූර්ණ අබායා/මුහුණු ආවරණ පැළඳීමෙන් හෝ මුස්ලිම් පල්ලියට පැමිණීමෙන් වළකින ලෙස මුස්ලිම් කාන්තාවන්ට ලබා දී ඇති අවවාදාත්මක උපදෙස් ඔවුන්ගේ ආගමික නිදහස පිළිබඳ ප්‍රශ්න කිරීමට හේතු වේ. එයින් ගම්‍ය වන්නේ ප්‍රචණ්ඩත්වයට ඇති බිය නිසා මුස්ලිම් කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම් සහ ඔවුන්ගේ ඇදහිල්ලට අනුකූල පිළිපැදීම් සිදුකිරීමේ හැකියාව සීමා කිරීමට හෝ කප්පාදු කිරීමට හැකි බවයි. මෙම තත්ත්වය ආගමික නිදහස සහ සමානාත්මතාවයේ මූලධර්ම වලට පටහැනි වන අතර මේ හේතුවෙන් මුස්ලිම් කාන්තාවන් ඔවුන්ගේම ආගමික ප්‍රජාව තුළ කොන් කිරීම් වලට සහ බැහැර කිරීම් වලට ද ලක් වීමට හේතු විය හැක.

දෙවනුව, ඊද් උත්සවයේදී මුස්ලිම් කාන්තාවන් ප්‍රවේශම් විය යුතු බව අවධාරණය කිරීමෙන් ඇඟවෙන්නේ ඔවුන් පිරිමින්ට වඩා විශාල ආරක්ෂක අවදානමකට මුහුණ දෙන බවයි. මෙම ලිංගිකත්ව නැමියාව ඉස්මතු කරන්නේ මුස්ලිම් කාන්තාවන් බොහෝ විට ඉස්ලාම් භීතිකාව සහ වෛරී අපරාධවල බර දරා සිටීම හේතුවෙන් වන අතර එමඟින් ඔවුන්ගේ ආගමික ඇදහීම් බියෙන් තොරව ක්‍රියාත්මක කිරීමට ඇති නිදහස සීමා කළ හැකි බවයි. මෙමගින් ආරක්ෂක අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමේදී සහ මුස්ලිම් කාන්තා අයිතීන් සුරැකීම සහතික කිරීමේදී ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී ප්‍රවේශයන් අවශ්‍ය වන බව තවදුරටත් තහවුරු කරනු ලබයි.

තෙවනුව, ඊද් උත්සවය තුළ ප්‍රජාවගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා පොලිසිය සහ මුස්ලිම් පල්ලි නිළධාරීන් අතර සහයෝගීතාවය, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ ආගමික නිදහස ප්‍රවර්ධනය කිරීම සඳහා දිරි ගන්වන පියවරකි. කෙසේ වෙතත්, එවැනි ආරක්ෂක පියවරයන් පුද්ගලයන්ට තම ආගම ඇදහීමට සහ ඔවුන්ගේ අනන්‍යතාවය නිදහසේ ප්‍රකාශ කිරීමට ඇති අයිතියට බාධාවක් නොවන බව සහතික කිරීම අත්‍යවශ්‍ය වේ.

### 13) විනිසුරුවරුන්ගේ සහ නීතිඥයන්ගේ ඇඳුම

2023 මාර්තු 30 වැනි දින අංක 2325/44 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කරන ලද අතර එමඟින් විනිසුරුවරුන්ගේ සහ නීතීඥවරුන්ගේ ඇඳුමට අදාළ නීති සංශෝධනය කරන ලදී. පෙර පැවති නීති අවලංගු කරන නව නීතියට අනුව, කාන්තා නීතීඥවරියන්ගේ ඇඳුම සුදු, කළු, අඩ සුදු, අළු, හෝ ලා දම් පැහැ සාරිය සහ ජැකට්, සුදු බ්ලවුස් සහ කළු කබාය සහ සපත්තු සහිත කළු කලිසම්, හෝ සුදු බ්ලවුස් සහ කළු කබාය සහ සපත්තු සහිත කළු සායක් යන ඇඳුම් වලට සීමා කර ඇත. මෙම නව අධිකරණ ඇඳුම් රීතිය කාන්තා විනිසුරුවරියන්ට සහ නීතිඥවරුන්ට දණහිසට පහලින් කළු ගවුම් හෝ ගවුම් ඇඳීමට තවදුරටත් අවසර නොදේ. මෙම හදිසි ඇඳුම් මාරුව, සාමාන්‍යයෙන් අබායා ලෙස ලේබල් කර ඇති දිගු ගවුම අඳින මුස්ලිම් කාන්තා නීතීඥවරියන්ට බලපායි. මුස්ලිම් කාන්තා නීතීඥවරියන්ට අබායා අඳින්නේ නැතිව සාරිය හෝ දිගු බ්ලවුස් එකක් සහ කලිසමක් ඇඳිය යුතු බවට ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් උපදෙස් දී ඇති බවට දැනටමත් කාන්තා සංවිධානයකට මුස්ලිම් නීතීඥවරියන්ගෙන් පැමිණිලි ලැබී ඇත. සමහර තරුණ කාන්තා නීතීඥවරියන් පැවසුවේ ඔවුන් සාරිය සහ දිගු, කර උස බ්ලවුසයක් ඇඳ සම්පූර්ණ ශරීරය වසා ගැනීමට කැමැත්තක් දක්වන බවයි. ඔවුහු තම හිජාබය ගැන විශේෂ අවධානයක් දක්වන අතර මෙම ගැසට් පත්‍රයට අනුව එය පැළඳ සිටීමට හැකිවීම සහනයක් සේ සැළකූහ.

කෙසේ වෙතත්, මෙම ගැසට් පත්‍රය දැඩිව ක්‍රියාත්මක කළහොත්, මුස්ලිම් කාන්තාවන්ගේ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස පමණක් නොව, ඔවුන්ට රැකියා ස්ථානයේ සීමාවකින් තොරව අධිකරණ කටයුතුවල නිදහසේ යෙදීම ද වළක්වාලමින් නිදහසේ තම වෘත්තියෙහි යෙදීමේ අයිතිය ද උල්ලංඝනය විය හැකිය.

සම්මුඛ පරීක්ෂණයට භාජනය වූ බොහෝ දෙනෙක් අනුමාන කළේ නව නීතිය දැනටමත් අබායා පැළඳ සිටින මුස්ලිම් කාන්තා විනිසුරුවන්ට සහ නීතිඥයින්ට බලපානු ඇති බවයි. මෙම ගැසට් පත්‍රයට පෙරාතුව පැවති නීති මගින් විනිසුරුවරියන්ට සහ නීතිඥවරියන්ට දිගු ගවුම් කාණ්ඩය යටතේ අබායා ඇඳීමට අවසර දී තිබුණි, කෙසේ වෙතත්, නව ගැසට් පත්‍රයෙන් දිගු ගවුම ඉවත් කිරීමෙන් ඔවුන්ට එය ඇඳීමට අවසරයක් නොමැති බවත්, එමගින් මුස්ලිම් කාන්තා විනිසුරුවරියන්ට සහ නීතීඥවරියන්ට රැකියා ස්ථානයේ අවාසිදායක තත්වයක් ඇති විය හැකි බවත්, අධිකරණ පරිශ්‍රයේදී කාන්තාවන්ට වෙනත් ආකාරයේ රැකියා ස්ථාන වල සිදු වන හිරිහැර සිදු විය හැකි බවත් හැඟී යයි. මෙහිදී අත්‍යාවශ්‍යයෙන්ම තහවුරු කොට ගත යුතු කාරණය වනුයේ අවශ්‍ය සංවර, විනීත භාවය සහතික කරන අතරම, ඇඳුම් පැළඳුම් සම්බන්ධ නීති රීති මඟින්, වෙනස් කොට සැලකීම් සිදු නොකෙරෙන බවත්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයේ මූලධර්ම උල්ලංඝනය නොකරන බවත් තහවුරු වීම අත්‍යවශ්‍ය බවයි. මෙම අවස්ථාවෙහිදී, නව නීති මගින් ඇතැම් කාන්තා කණ්ඩායම්වලට වෙනස් කොට සැලකීමක් සිදුවන බව පෙනී යන අතර, එයද අධිකරණ ක්ෂේත්‍රය තුළ ව්‍යවස්ථාපිත අයිතීන් කඩ කරන (12 සහ 10 වගන්ති) අතර, එමඟින් අනෙකුත් කාන්තාවන් ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන විට යුක්තිය ඉල්ලා සිටීමට යොමු වීම අධෛර්යමත් විය හැකිය.

### 14) MMDA ප්‍රතිසංස්කරණ පිළිබඳ මතභේදය

ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස උල්ලංඝනය කරන ලිංගික ප්‍රචණ්ඩත්වය අලුත් දෙයක් නොවෙයි. මෙම ප්‍රවණතාවය දීර්ඝ කාලයක් තිස්සේ ශ්‍රී ලාංකික මුස්ලිම් කාන්තාවන්ට නීතිමය රාමුව තුළ පවා බලපෑමක් ඇති කර ඇත. 1770 බතාවියානු (*Batavian*) නීති සංග්‍රහයකින් ව්‍යුත්පන්න වූ මුස්ලිම් විවාහ සහ දික්කසාද පනතේ (*MMDA*), ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්ව වෙනස් කොට සැලකීමේ අංග ප්‍රදර්ශනය කරන විධිවිධාන අඩංගු වන

අතර, ශ්‍රී ලංකාව අත්සන් තබා ඇති *CEDAW* සම්මුතියේ සඳහන් බැඳීම් වලටද පටහැනි වේ. මෙම පනත ප්‍රතිසංස්කරණය කරන ලෙස කෙරෙන ඉල්ලීම් මුල් වරට ඉදිරිපත් වූයේ 1954 දී වන අතර ඉන් අඩ සියවසකට වැඩි කාලයක් ගත වී ඇතත්, *MMDA* තවමත් ප්‍රතිසංස්කරණය කර නොමැත.

1951 දී, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (*MMDA*) සම්මත කරන ලද අතර, එය මුස්ලිම් ප්‍රජාව තුළ බහුලව පවතින චාරිත්‍ර රාශියක් පද්ධතිගත කරන ලදි. මෙම නීතිය සාමාන්‍ය අධිකරණ පද්ධතියක් හරහා පරිපාලනය නොකරන අතර එය පුද්ගලයෙකු විසින් පාලනය කරනු ලබන 'ක්වාසි' නම් තනතුරක් මගිනි පරිපාලනය කරනු ලැබේ. මෙම නීතිය ක්‍රියාත්මක කිරීම ආරම්භ වී ටික කලකට පසු මුස්ලිම් කාන්තාවන් සහ ගැහැණු ළමයින් කොන්කිරීම්, වෙනස්කොට සැළකීම්, අවාසි සහ පීඩනයන් අත්විඳීමේ වර්ධනයකක් දක්නට ලැබිය හැකි විය. එමෙන්ම මෙමඟින්, පිරිමින් තම කලත්‍රයාගේ අනුදැනුමකින් තොරව යම් යම් ක්‍රියාවන් නීත්‍යානුකූල කිරීම සඳහා තත්වය ප්‍රයෝජනයට ගනිමින් සිටිති. මෙයට තම සහකරුවන්ට අයුතු ලෙස සැලකීම, බහු විවාහ හතරකට වඩා වැඩි ගණනක නියැලීම සඳහා විවාහ ලියාපදිංචිය මග හැරීම, ළමා නඩත්තු වගකීම් මඟහැරීම, බාල වයස්කාර විවාහ ප්‍රවර්ධනය කිරීම, බලහත්කාර විවාහ සහ නව යොවුන් වියේ ගැබ් ගැනීම් සඳහා අනුබල දීම සහ ක්වාසි විනිසුරුවරුන්, රෙජිස්ට්‍රාර්වරුන් හෝ ජූරි සභිකයන් ලෙස භූමිකාවන් දැරීමට කාන්තාවන්ට අවස්ථාව අහිමි කිරීම යන කාරණා ඇතුලත්වේ.[17]

වත්මන් පනතට අනුව වයස අවුරුදු 12ට අඩු ඕනෑම අයෙකුව ක්වාසි වරුන්ගේ කැමැත්ත ඇතිව විවාහ කර දිය හැකිය. මෙය ප්‍රායෝගිකව ගත් කල ශ්‍රී ලංකාව තුළ මුස්ලිම් ගැහැණු දරුවන් හට විවාහ වීම සඳහා වයස් සීමාවක් නොපැණවේ. මෙම පසුබිම තුළ මුස්ලිම් කාන්තාවන් 1980 සිට *MMDA* හි ප්‍රතිසංස්කරණ දිනා ගැනීම සඳහා පෙනී සිටීමට පටන් ගෙන ඇත.

මෙම පනත ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාවය පිළිගනිමින්, 1970 සිට රජය විසින් ගැටළුව පිළිබඳ සොයා බැලීමට සහ ප්‍රතිසංස්කරණ යෝජනා කිරීමට විවිධ කමිටු හයක් පිහිටුවා ඇත.

මෙම කමිටු වල සොයා ගැනීම් සහ කාන්තා කණ්ඩායම් සහ වින්දිතයන් ගේ ඊත්තු ගැන්වීම මත වත්මන් අධිකරණ අමාත්‍ය විජේදාස රාජපක්ෂ මහතා විවාහ වීමේ අවම වයස අවුරුදු 18 ට සීමා කිරීම, විවාහ ලියාපදිංචි කිරීම අනිවාර්ය කිරීම, විවාහයට කාන්තාව ගේ කැමැත්ත සහ විවාහ සහතිකයේ කාන්තාවගේ අත්සන අනිවාර්ය කිරීම, ස්ත්‍රීන් හා පුරුෂයන් සඳහා සමාන දික්කසාද නීතීන්, බහු විවාහය අහෝසි කිරීම, ක්වාසි විනිසුරුවන්ට දිස්ත්‍රික් අධිකරණ රාමුව තුළ සමථකරුවන් ලෙස ක්‍රියා කිරීමට හැකි වන සේ ක්වාසි ක්‍රමය ඉහළ දැමීම වැනි වැදගත් සංශෝධන ඇතුළත් ප්‍රතිසංස්කරණ පත්‍රිකාවක් අවසන් කර ඇත. මෙම සියලු ප්‍රතිසංස්කරණ දශක ගනනාවක මුස්ලිම් කාන්තාවන්ගේ ඉල්ලීම් වලට අනුකූල වේ.

ප්‍රතිසංස්කරණය නොකළ *MMDA* සහ ක්වාසික්‍රමය තුලින් මුස්ලිම් කාන්තාවන් අඛණ්ඩව පීඩාවට පත් කිරීම, මුස්ලිම් ප්‍රජාව තුළ මුල්බැසගත් පීතෘ මූලිකත්වය සහ පුරුෂ ස්වෝත්තමවාදී ස්වභාවය ප්‍රකාශනය කරයි. සමස්ත ලංකා ජම්මිතුල් උලේමා සංවිධානයේ ස්ත්‍රීන්ට එරෙහි ද්‍රෝහීකම් සිදු කරන මුස්ලිම් පිරිමි නායකත්වයේ සහායද ඇතිව දැනට පාර්ලිමේන්තුවේ

17 Sunday Observer, Ameer Faiz, 'MMDA: Who is blocking reform of this discriminatory law?', 12th August 2018, https://www.sundayobserver.lk/2018/08/18/issues/mmda-who-blocking-reform-discriminatory-law

සිටින මුස්ලිම් පිරිමි මන්ත්‍රීවරු 18 දෙනෙකු *MMDA* සඳහා යෝජිත ප්‍රතිසංස්කරණ ව්‍යර්ථ කිරීමට උත්සාහ දරමින් සිටිති. මේ තත්වය නිසා කාන්තාවන්ට සමානයින් ලෙස නොසැළකීමේ ඉස්ලාමික, ආගමික පදනමක් නොමැති සංස්කෘතිය පදනම් කරගත් ප්‍රතිපත්තිය නිසා ස්වකීය ආරක්ෂාව සඳහා හෝ කාන්තාවන් බලගැන්වීමේ අයිතියද ප්‍රතික්ෂේප වී ඇත.

*MMDA* හි ස්ත්‍රී-පුරුෂ වෙනස් කොට සැලකීමේ විධි විධාන වලට ගොදුරු වූ මුස්ලිම් කාන්තාවන් සහ එහි ප්‍රතිසංස්කරණ ඉල්ලා සිටින මුස්ලිම් කාන්තාවන් දිගු කලක් තිස්සේ ප්‍රජාව විසින් හිරිහැර වලට හා කොන් කිරීම් වලට ලක්කොට ඇත. මෑත අතීතයේ බොහෝ බිම් මට්ටමේ ක්‍රියාකාරීන් සහ ඔන්ලයින් අවකාශයේ ක්‍රියාකාරීන් රජයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට සම්බන්ධ වීම නිසා බරපතල ප්‍රහාරයන්ට පවා ලක්විය. පුත්තලම මුස්ලිම් කාන්තා සංවර්ධන භාරයේ නිර්මාතෘවරිය වන ජුවේරියා මොහිදීන් හට මුස්ලිම් ප්‍රජාවගේ මෙන්ම විශේෂයෙන්ම පුත්තලම මහ පල්ලියට සම්බන්ධ ප්‍රාදේශීය දේශපාලනඥයින්ගේ සහ පිරිමින්ගේ විවිධ තර්ජන හා ඝර්ජන වලට මුහුණ දීමට සිදුවිය. 2023 ජනවාරි 10 දින පුත්තලම නගරයේ මුස්ලිම් පල්ලිය විසින් සන්ධ්‍යා යාඥාවෙන් පසු, 2022 නොවැම්බර් 14 වන දින *MMDA* ප්‍රතිසංස්කරණ පත්‍රිකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අධිකරණ අමාත්‍යවරයා හමුවීමට ගිය කාන්තා කණ්ඩායම පිළිබඳව නිවේදනයක් නිකුත් කරන ලදී.

මෙය ඉස්ලාම් දහමට එරෙහි ක්‍රියාවක් ලෙස හෙළා දකින ඔවුන් එය විදේශ බලවේග (*NGO*) විසින් මෙහෙයවන ලද්දක් බව වැඩිදුරටත් සඳහන් කළේය. 2023 ජනවාරි 13 වන දින සිකුරාදා යාඥාවෙන් පසු මුස්ලිම් පල්ලිය පිරිමින් ඒකරාශීකර ප්‍රසිද්ධ විරෝධතාවක් පැවැත්වීමට පටන් ගත් අතර එහිදී මුස්ලිම් කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින ක්‍රියාකාරීන් අපහාසයට ලක් කරන ලදි. තව දුරටත් විරෝධතාකරුවන්ගේ පෝස්ටර් සහ සමාජ මාධ්‍ය ප්‍රචාර, මොහිදීන් මහත්මිය සහ ඇයගේ සංවිධානය ඉලක්ක කර ගනිමින් පළ කරන ලදි.

මුස්ලිම් කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් කටයුතු කරන ක්‍රියාකාරීන්ගේ අභියාචනයට එරෙහිව අධිකරණ අමාත්‍යවරයාට ලබාදීමේ අරමුණින්, පුත්තලමේ මුස්ලිම් පල්ලි විසින් අත්සන් ව්‍යාපාරයක්ද ආරම්භ කරන ලදී. *MMDA* ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් ක්‍රියා කරන විදේශීය බලවේගද වක්‍රව හෙළා දකිමින් ෆේස්බුක් පෝස්ට් සහ මීම්ස්ද සංසරණය විය. තවත් තැනක පෙරකී අධිකරණ අමාත්‍යවරයාගේ රැස්වීමට සහභාගි වූ වින්දිතයන් කිහිප දෙනෙකුට තර්ජන එල්ල වූ අතර, ඔවුන් ශාරීරික ප්‍රහාර වලට ද ගොදුරු වීමේ අවධානමක් තිබූ බැවින් අඩු තරමින් ඔවුන්ගෙන් කිහිප දෙනෙකු තම නිවෙස් වලින් තාවකාලිකව ඉවත් කිරීමට සිදුවිය. 2022 නොවැම්බර් 15 වැනි දින අපවාදාත්මක වීඩියෝවක් සමාජ මාධ්‍ය ජාල තුල පළ කොට තිබුණි. මෙම අපවාදාත්මක වීඩියෝව *MMDA* ප්‍රතිසංස්කරණ සඳහා කටයුතු කරමින් හුන් සමාජ ක්‍රියාකාරීන් කිහිපදෙනෙකු පරිභවයට ලක් කිරීම අරභයා මුස්ලිම් ප්‍රජාවේ යම් පිරිසක් විසින් නිර්මාණය කරන ලද්දක් විය. සහෝදරීත්වයේ මුලපිරුම (*Sisterhood Initiative*) නම් සාමූහිකයේ නිර්මාතෘ නබීලා ඉක්බාල් සහෝදරිය මෙම වීඩියෝව මඟින් අපහාසයට ලක් කරන ලද අයෙකි. ඇයගේ රාජකාරි කටයුතු හා සංවිධානයේ වැඩ කටයුතු සියල්ලම පදනම් වී පැවතුණේ සමාජ මාධ්‍ය ක්‍රියාකාරීත්වය මත හෙයින් මෙම අපහාසාත්මක වීඩියෝව ඇයගේ කාර්යයන් කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කරන ලදී. වසර ගණනාවක් තිස්සේ ඉක්බාල් මෙන්ම මුස්ලිම් ප්‍රජාව අතරින් කාන්තා අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රියාත්මක වූ බොහෝ ක්‍රියාකාරීන්, අනේකවිධ හිංසාවන්ට ලක් වූහ. මුස්ලිම් කාන්තා අයිතීන් වෙනුවෙන් සටන් කරන මුස්ලිම් සහෝදරියන් හට දැඩි දුෂ්කරතා මධ්‍යයේ සිය සේවාදායකත්වය සැපයීමට සිදුවී ඇති අතර ස්ත්‍රීද්‍රෝහී ආකල්ප සහිත ස්ව ප්‍රජාවේ සාමාජිකයින්ගෙන් හා බාහිර ජාතිවාදීන්ගෙන් එල්ල වන අනවරත පීඩාවන්ට නිතර මුහුණ

දෙන්නට සිදුවී ඇත. ප්‍රජා ක්‍රියාකාරීත්වය තුළ ඇගේ අත්දැකීම් අප හා බෙදා ගනිමින් ඉක්බාල් මහත්මිය ප්‍රකාශ කළේ බලහත්කාර විවාහ, *MMDA* ප්‍රතිසංස්කරණ හා කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් ඇය සටන් කරන විට දිගින් දිගටම ඇය නිසි මුසල්මානුවෙකු නොවන බවට අපහාස කළ බවත් ඇයගේ ආගමික විශ්වාස පිළිබඳව ප්‍රශ්න කෙරෙන ලද බවත්ය. නමුත් මෙකී පුද්ගලයින්ම මුස්ලිම් ප්‍රජාවෙහි අයිතීන් රජය මඟින් හෝ වෙනත් කණ්ඩායම් මගින් උල්ලංඝනය කළ අවස්ථාවන් හි මුස්ලිම් ප්‍රජාව වෙනුවෙන් පෙනී සිටින ලෙස ඇයගෙන් ඉල්ලා සිටි බවද ඇය තව දුරටත් ප්‍රකාශ කළාය.

ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව මාර්ගගතව මෙන්ම සමාජ මාධ්‍ය තුළ ද සැලකිය යුතු අන්දමේ සක්‍රීය ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වලින් මුස්ලිම් කාන්තා ක්‍රියාකාරීන් ඉලක්ක කර ගනිමින් වෛරී ප්‍රකාශ හා හිරිහැර කිරීම පිළිබඳ නිරන්තරයෙන් වාර්තා වෙමින් පවතී. නිර්භීතව තම අදහස් ප්‍රකාශ කරන සහ සමාජ ක්‍රියාකාරීත්වයේ යෙදෙන මෙම කාන්තාවන් ස්වකීය ප්‍රජාව තුළම අන්තර්ජාල ප්‍රහාර වලට ලක්ව ඇත.

කාන්තා අයිතිවාසිකම් පිළිබඳ කටයුතු වල නිරත වීම නිසා මුස්ලිම් ප්‍රජාව තුළ අන්තර්ජාල භාවිතා කරන්නන්ගේ විවේචන හා හෙළා දැකීම් වලට පාත්‍ර වූ මුස්ලිම් දේශපාලන නායිකාවක් මෙන්ම පළාත් පාලන නියෝජිතවරියක්ද වූ බිස්ලියා භූතෝ නමැති කාන්තාව පිළිබඳව සුවිශේෂී සිදු වීමක් වාර්තා විය. ඉස්ලාම් ධර්මයේ මූලික මූලධර්ම වලට පටහැනිව කටයුතු කරන බවට ඇයට විරුද්ධව චෝදනා එල්ල කරන ලදි. එපමණක් නොව සමාජ මාධ්‍ය වල මුහුණ ප්‍රදර්ශනය කිරීම හෝ සමාජ ක්‍රියාකාරකම් වලට සක්‍රීයව සහභාගී වීම නිසා අන්තර්ජාලය හරහා කාන්තාවන්ට හිරිහැර, පීඩා වලට ලක් වීමට සිදුවූ අවස්ථා රාශියක් වාර්ථා වී ඇත. මෑත කාලීනව බොහෝ කාන්තා ක්‍රියාකාරීන් විසින් නිරීක්ෂණය කරන ලද කාරණාවක් වනුයේ අධ්‍යාපන ආයතන වල, විශේෂයෙන් පාසල් වල හා විශ්ව විද්‍යාල වල සිටින මුස්ලිම් පිරිමි පුද්ගලයින් විසින් ප්‍රසිද්ධ පෝස්ටර්/ බැනර්/ පොත් පත්වල මුස්ලිම් කාන්තාවන්ගේ මුහුණු අපැහැදිලි කිරීමට හෝ මකා දැමීමට උත්සාහ දරන බවයි. මෙම ගැටළුව විසඳීම සඳහා මුස්ලිම් තරුණ පිරිමින් තුල ප්‍රකාශනයේ නිදහස සහ ලිංගිකත්ව සමානත්මතාවය පිළිගත හැකි ආකාරයේ පරිවර්තනීය මානසිකත්ව වෙනසක් අවශ්‍ය බව ඉස්මතු කොට දක්වයි. මෙම අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටින ක්‍රියාකාරීන් තර්ක කරන්නේ ගැහැණු ළමයින් මෙන්ම කාන්තාවන් ද සක්‍රියව මාර්ගගත සංවාද වල යෙදීමට සහ විවිධ ආකාරයේ මාර්ගගත ක්‍රියාකාරීත්වයන්ට සහභාගී වීමට දිරි ගැන්වීම ඉතා වැදගත් බවයි. විශ්වාසයක් දැරීමට හා ඇදහීමට ඇති අයිතිය ප්‍රවර්ධනය කිරීමෙන් හා ආරක්ෂා කිරීමෙන්, මුස්ලිම් ප්‍රජාව තුළ සිටින සෑම අයෙකුටම ඇතුලත් විය හැකි සහ සියල්ලන්ටම ගරු කෙරෙන මාර්ගගත පරිසරයක් පෝෂණය කිරීමට අවස්ථාව උදා වේ.

*MMDA* ප්‍රතිසංස්කරණ පිළිබඳව සමාජ මාධ්‍ය ජාලා හරහා පළ කළ සංවාද හේතුවෙන්ද මුස්ලිම් කාන්තාවන් ප්‍රජාවේ ද්වේශයට හා ප්‍රහාරයට ලක් වේ. 2023 මැයි මාසයේ දී ෂම්ලා නලීර් ඇගේ නික්කා (විවාහ) සහතිකය[18] අත්සන් කරන ඡායාරූපයක් ට්විටර් සමාජ මධ්‍යා ජාලාවෙහි[19] පළ කර ඇති අතර මේ සඳහා ඇයට බොහෝ සුභ පැතුම් පණිවුඩ ලැබී තිබුණි. එමෙන්ම ඇයට එරෙහිවද බොහෝ පණිවුඩ එවා තිබූ අතර ඇයගේ විවාහය දික්කසාදයකින් කෙළවර වනු ඇතැයි ද ප්‍රාර්ථනා කොට තිබුණි.

---

18 Under MMDA 1951 a woman cannot sign her marriage certificate. She must be given in by her guardian (Wali) to the bridegroom thus there is no place for the bride to sign in the Muslim marriage certificate.

19 Twitter, Batapola Antenna, 23rd May 2023, https://twitter.com/97shamster/status/1661037121774448640?s=20

# නිගමන හා නිර්දේශ

බොහෝ කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරීන් සහ වින්දිතයින් මෙම පරීක්ෂණය සඳහා සම්මුඛ සාකච්ඡාවට ලක් කෙරුණු අතර ඔවුන්ගේ අදහස වූයේ තම ප්‍රජාවන් තුල පිරිමින් විසින් සාම්ප්‍රදායික ලිංගිකත්ව භූමිකාවන්ට අනුගතවීම සඳහා කාන්තාවන් පොලඹවා ගැනීමට ආගම මෙවලමක් වශයෙන් භාවිතා කරනු ලබන බවයි. ඔවුහු ආගමික වෛරය හා බෙදීම් අවුළුවාලමින්, එකිනෙකාට එරෙහිව කාන්තාවන් පොළඹවමින් ඔවුන්ගේ අනාරක්ෂිතභාවය තවදුරටත් තීව්‍ර කරනා අතරම, ස්වකීය පාරිශුද්ධභාවය හා ප්‍රජනන හැකියාව පවත්වා ගනිමින් සම්ප්‍රදායික ස්ත්‍රී භූමිකාව තුල ඇය සිර කර තබනු ලබයි. මෙම ප්‍රවණතා සමාජයට හානිදායක මෙන්ම අහිතකර ප්‍රතිඵල ගෙන එනු ඇත. ඒ වෙනුවට පුද්ගල නිදහසට හා විවිධත්වයට ගරු කෙරෙන හා අගය කෙරෙන, වඩා වැදගත් ලෙස සහජීවනය සහ ඉවසීම ප්‍රවර්ධනය කෙරෙන, සැමට සමානව හා සාධාරණව ප්‍රවේශ විය හැකි ආගමික වත්පිළිවෙත් දියුණු කිරීම සඳහා ඔවුහු පෙනී සිටියහ.

මුස්ලිම් කාන්තා ක්‍රියාකාරීන්ට එරෙහිව ගෙන ආ විවේචන බොහෝ විට නිසි ලෙස යොමුවී නොතිබුණු අතර ඒවායේ අරමුණ වනුයේ මෙම ක්‍රියාකාරීන් අපකීර්තියට හා පීඩාවට පත්කොට, කාන්තා අයිතීන් සඳහා වන අරගලය අතහැර දැමීම සඳහා පෙළඹවීමයි. කෙසේ වෙතත් වසංගත තත්වයක දී වේවා, ආර්ථික හෝ දේශපාලනික අර්බුදයක දී වේවා, කාන්තාව මුහුණ දෙන ගැටළු සැමදා බහුලව පවතින අතර ඒ සෑම විටක දීම ප්‍රජා අරගල සඳහා බලමුලු ගන්වන්නේ මුස්ලිම් ප්‍රජාව තුලම සිටින එම කාන්තා ක්‍රියාකාරීන්මය. මෙම කැප කිරීම් සාමාන්‍යයෙන් ප්‍රජාවේ සාමාජිකයින්ගේ අවධානයට ලක් නොවේ. එමෙන්ම බොහෝ කාන්තා ක්‍රියාකාරීන්ව එකී අවස්ථානුකූලව කැමැත්තට හා අභිප්‍රායයට අනුව මුස්ලිම්වරුන්සේ පිළිගනු ලැබූ අතර, තවත් වරෙක එසේ පිළිගනු නොලැබූහ.

ඉහත සාකච්ඡාවට ගැනුණ බොහෝ සිදුවීම් වලින් ගම්‍ය වන අත්දැකීම පිළිබඳව විමර්ශනයේදී ප්‍රස්තුත වූ ප්‍රධාන කාරණය වනුයේ ආරක්ෂාව හා මූලික නිදහස (සංචරණය, ආශ්‍රය කිරීම, රැස්වීම, කුරිරු හා අවමන් සහගත සැලකීම් වලින් තොර වීම වැනි) අතර වන අන්තර්ජේදනීය ස්වභාවයයි. මේ සියලු සිදුවීම් අධ්‍යයනයේදී ප්‍රත්‍යක්ෂ වූ මූලික කාරණාව වූයේ මුස්ලිම් කාන්තාවන්ද ඇතුලු සියලුම පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සහ නිදහස තහවුරු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා සෑම අයෙකුම ඇතුලත් විය හැකි ලිංගිකත්ව සමාජභාවයන්ට සංවේදී වූ, ප්‍රවේශයන්ගේ දැඩි අවශ්‍යතාවයයි. මේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම් තව දුරටත් වර්ධනය වීමට මාර්ග සැලසෙනුයේ රජය මගින් ගනු ලබන ක්‍රියා මාර්ග හේතුවෙන් හෝ නොඑසේ නම් නිසියාකාරව ක්‍රියාත්මක නොවීම හේතුවෙනි. ඉහත මතු කර ඇති කරුණු වලට අනුව අපි පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර සිටිමු.

**ශ්‍රී ලංකාවේ රජය වෙත:**

*1.* සිඩෝ සම්මුතියේ වගකීම් දැඩි ලෙස බලාත්මක කළ යුතු අතර, සිඩෝ ජාතික ආයතනය මගින් අධීක්ෂණය කළ යුතුය.

*2.* කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරීන්, බිම් මට්ටමේ ක්‍රියාත්මක වන සංවිධාන, පහත් කොට සැලකීම් වලට මුහුණ දෙන පෙරමුණේ සිටින කාන්තාවන්, කාන්තා දේශපාලන නායිකාවන්, දේශපාලන නායකයින් සහ ආගමික නායකයින්ගේ සහභාගිත්වයෙන් ප්‍රතිපත්ති මට්ටමේ සංවාද ඇති කළ යුතුය.

3. කාන්තා සමානත්මතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති මට්ටමේ පරිවර්තන වැඩපිළිවෙලක් කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුයි.

4. වෙනස්කොට සැළකීමේ සම්භාවිතාව අවම කරන සහ ඒ සඳහා වගවීම සිදු කරන ආකාරයේ නීති සම්පාදනය කළ යුතුයි. යෝජිත නීතිවල ලිංගිකත්ව සමාජභාවය මත පදනම් වූ බලපෑම් විශේෂයෙන්ම සැළකිල්ලට ගත යුතුය.

5. ත්‍රස්තවාදය වැළැක්වීමේ පණත අහෝසි කළ යුතු අතර සුළු ජාතීන්ට හිංසා කිරීම සඳහා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ ICCPR පනත අනිසි ලෙස භාවිතා කිරීම නතර කල යුතුය. අත්අඩංගුවට ගැනීම් සහ ඇප නිශ්චය කිරීම්, ලිංගිකත්ව සංවේදීතාවයෙන් යුතුව සිදුකළ යුතුය.

6. රෝහල්, පාසල්, උසාවි, බැංකු සහ වෙනත් ආයතන තුල මුස්ලිම් කාන්තාවනට ඔවුන්ගේ ඇඟළුම් පදනම මත වෙනස්කම් නොකරන බවට සහතික වීම.

7. සුළුතර ප්‍රජාවන්ට එරෙහිව ප්‍රචණ්ඩත්වය අවුළුවන, වැරදි තොරතුරුවලට එරෙහිව සටන් කිරීම සහ වෛරී ප්‍රකාශ (වඩාත් නිශ්චිත ලෙස සමාජභාවය පදනම් කරගත් වෛරී ප්‍රකාශ) වලට එරෙහිව නඩු පැවරීම.

8. ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය හා සමගාමීව MMDA වහාම ප්‍රතිසංස්කරණය කළ යුතු අතර එයට අනුව මුස්ලිම් කාන්තාවන්ට නීතිය යටතේ අනෙකුත් ශ්‍රී ලාංකීය කාන්තාවන් හා සමානව සැළකීම සහතික කිරීම සහ ළමා විවාහ, යොවුන්වියේ ගැබ් ගැනීම් සහ බලහත්කාර විවාහ වලින් මුස්ලිම් දරුවන් ආරක්ෂා කිරීම තහවුරු විය යුතුයි.

9. ශ්‍රී ලාංකික මුස්ලිම්වරුන් දෙදෙනෙකු සාමාන්‍ය විවාහ හා ලියාපදිංචි ආඥාපනත යටතේ විවාහ වීම වළක්වන වගන්තිය රජය විසින් වහාම ඉවත් කළ යුතුය.

10. කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ මූලික අයිතීන් පූර්ණව සහතික කිරීම. ඒවා උල්ලංඝනය කෙරෙන සියලුම චාරිත්‍ර වාරිත්‍ර සහ ආගමික චත්පිළිවෙත් වහාම නතර කල යුතු අතර කාන්තා ලිංගික අවයව ඡේදනය, අපරාධයක් සේ සැලකිය යුතුයි. මුස්ලිම් කාන්තාවන් හා ගැහැණු ළමයින්ගේ නඩු, සාමාන්‍ය අධිකරණ පද්ධතියෙන් හුදෙකලා කොට පසෙකින් නොතබා, ඔවුන්ට ද සාමාන්‍ය නීතිය යටතේ යුක්තිය පසිඳලීම සඳහා ඇති ප්‍රවේශය තහවුරු කළ යුතුය.

**අන්තර්ජාතික ප්‍රජාව සඳහා යෝජනා :**

1. ඉස්ලාම් භීතිකාව නැගී ඒමේ ප්‍රවණතාවයට විරුද්ධව කටයුතු කිරීමට හා සුළු ජාතික ප්‍රජාවන් තව දුරටත් පීඩාවට පත් කෙරෙන අත්තනෝමතික, ත්‍රස්ත විරෝධී ව්‍යුහයන් හරහා පාස්කු ඉරිදා ප්‍රහාරය නරුම ආකාරයෙන් යොදා ගැනීම ප්‍රතික්ෂේප කිරීම. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම සඳහා ඉල්ලා සිටීම, යෝජිත ප්‍රතිත්‍රස්ත පනත ප්‍රතික්ෂේප කිරීම සඳහා බලපෑම් කිරීම මෙන්ම 2007 ICCPR පනත යොදා ගනිමින් සුළුතර ප්‍රජාවන් හිංසනයට හා පීඩාවට පත් කිරීම හෙළා දැකීම.

2. ඒ අතරම ඉස්ලාම් භීතිකාවට එරෙහිව සටන් වැදීම යනු කාන්තා අයිතිවාසිකම් අත්හැරීම නොවන බව පිළිගැනීම. වසර 40 කට වැඩි කාලයක් තිස්සේ MMDA ප්‍රතිසංස්කරණ සඳහා

කැපවී සිටින, මුස්ලිම් කාන්තා අයිතිවාසිකම් සටනේ ක්‍රියාකාරීන්ගේ ඉල්ලීම් හඳුනාගෙන සහයෝගය දැක්වීම.

*3.* සිඩෝ සහ අනෙකුත් මානව හිමිකම් ලේඛණ යටතේ සිය වගකීම් වලට ගරු කිරීමට සහ ඒවා බලාත්මක කිරීමට ශ්‍රී ලංකාවේ රජයෙන් ඉල්ලා සිටීම.

# මූලාශ්‍ර:

Fuller, L., & Rizwie, R. (2019, June 16). Muslims ‘targeted with arbitrary arrests’ after Easter massacre. Human Rights | Al Jazeera. Retrieved April 26, 2023, from https://www.aljazeera.com/features/2019/6/16/muslims-targeted-with-arbitrary-arrests-after-easter-massacre.

Confidential report on Freedom of Religion or Belief, 2023

Saroor, author: S. A. (2022, February 19). Women victims of the prevention of terrorism act. Colombo Telegraph. Retrieved May 1, 2023, from https://www.colombotelegraph.com/index.php/women-victims-of-the-prevention-of-terrorism-act/.

#MINORMATTERS